සැ. යු.—මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටසේ 2006 වර්ෂයේ ජූලි - සැප්තැම්බර් කාර්තුවට අදාලව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වු පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,619 - 2009 සැප්තැම්බර් මස 11 වැනි සිකුරාදා - 2009.09.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1298 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1300 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 සැප්තැම්බර් මස 18 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 සැප්තැම්බර් මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරින් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත් දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. **සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරින්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. **ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරින්ට අදාළ සේවා කොන්දේසි :**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දක්වෙන අනිකුත් කොන්දේසිවලටද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහූ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරින්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරින්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරින් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදලා හරිණු ලැබූ යුද්, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාව යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

5. **යුද්ධ සේවා අනුග්‍රහය :**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේව මුක්ත හටයින් ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එස සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. **රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරිහු :**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූ ද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කළින් දැනට ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. **සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම :**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

8. **බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය :**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවුවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දි විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදි උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලීවීමට ද, යත්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුට ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාව යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කළින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුසංණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කැළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තිරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවුවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,

# තනතුරු – ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — රත්නපුර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශ වාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65 ට වැඩි නොවිය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන්, ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබා ගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2009 ඔක්තෝබර් මස 09 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 අගෝස්තු මස 11 වැනි දින,
අංක 234/A3,ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| රත්නපුර | කලවාන | රත්නපුර දිස්ත්‍රික්කයේ උඩපත්තුව කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා කුකුළු කෝරළය කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රත්නපුර. |

09-236

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු — අනුරාධපුර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතුය.

02. මෙම තනතුරු සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 65 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලා ගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබා ගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2009 ඔක්තෝබර් මස 09 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 අගෝස්තු මස 13 වැනි දින,
අංක 234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| අනුරාධපුරය | කැකිරාව | කලාගම් පළාත කොට්ඨාසයේ තිබ්බටුවැව ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරය. |

09-237

## ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### මෝටර් රියදුරු තනතුරු ඇබෑර්තු පිරවීම

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින මෝටර් රියදුරු තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පිරිමි පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *වැටුප් ක්‍රමය* :-වැටුප් පරිමාණය රු. 12,470-10x130-10x145-10x160-12x170-රු. 18,860 (step 22)(රු. 15,700 වැටුප් තලයෙන් ඔබ්බට යාමට ප්‍රථමයෙන් කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතා සම්පූර්ණ කළ යුතු ය.)

02. *වයස් සීමාව*:-අවු. 18ට නොඅඩු හා අවු. 45ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)මෙම අය අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් තම අයදුම් පත්‍ර ඉදිරිපත් කළ යුතු ය.

03. *අධ්‍යාපන සුදුසුකම්*:-අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසැලකින් අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/ 9 වැනි වසර සමත්ව තිබිය යුතු ය.

04. *වෘත්තීය සුදුසුකම්* :

(i) තාරබර හොණ්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32ට වඩා ගෙන යාමට බලපත්‍ර ඇති බස්රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබීම.

(ii) වාහන රියදුරෙකු වශයෙන් වසර තුනක පළපුරුද්දක් තිබිය යුතු ය. (සහතික මගින් සනාථ කළ යුතුය.)

(iii) මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු ය.

05. *ශාරීරික සුදුසුකම්.*—දිවා කාලයේ දී සහ රාත්‍රී කාලයේ දී සේවය යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය. අවම වශයෙන් උස අඩි 5 ක් විය යුතු ය.

06. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.*—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

07. *සේවා කොන්දේසි.*—ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වගන්ති අදාළ වේ.

08. *බඳවා ගැනීමේ ක්‍රමය.*—රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 යටතේ බඳවා ගනු ලැබේ.

09. *අයදුම්පත් එවිය යුතු අවසන් දිනය.*—පහත ආදර්ශ ආකෘතිය අනුව නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2009.10.12 වැනි දින හෝ ඊට ප්‍රථම බන්ධනාගාර කොමසාරිස් ජනරාල්, බන්ධනාගාර මූලස්ථානය, කොළඹ 09 ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, ලිපිය බහාලන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු ය.

වී. ආර්. සිල්වා, ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ අයිජී,
මේජර් ජනරාල්,
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.

2009 අගෝස්තු මස 12 වැනි දින දී ය,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.

### ආදර්ශ අයදුම්පත්‍රය

***ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුව මෝටර් රියදුරු තනතුර***

01. (i) සම්පූර්ණ නම :————.
(ii) මුලකුරු වලින් හැඳින්වෙන නම :————.

02. (i) ලිපිනය :————.
(ii) ජාතික හැඳුනුම්පත් අංකය :————.

03. පදිංචි ලිපිනය අයත්වන —
(i) දිස්ත්‍රික්කය :————.
(ii) පොලිස් ස්ථානය :————.

04. උපන් දිනය :————.

05. 2009.09.11 දිනට වයස :————.

06. පුරවැසිභාවය (පරම්පරාවෙන්ද, ලියාපදිංචි වීමෙන්ද යන වග) :————.

07. විවාහක ද?/ අවිවාහක ද?/වැන්දඹු ද? :————.

08. අධ්‍යාපන සුදුසුකම් (පැහැදිලිව දැක්විය යුතු ය) :————.

09. රියදුරු බලපත්‍ර අංකය හා ශ්‍රේණිය :————.

10. පළපුරුද්ද :————.

11. ඉල්ලුම්කරු දැනට රැකියාවක නියුක්ත නම්,
(i) පදවිය :————.
(ii) සේවය කරන ස්ථානය :————.
(iii) පත්වීමේ දිනය :————.

12. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියෙන් වරදකරු කරනු ලැබ තිබේද? : ඔව්/නැත (ඔව් නම් විස්තර සඳහන් කරන්න.) :————.

13. අයදුම්කරුගේ සහතිකය :

මෙම අයදුම්පතේ මවිසින් සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මගේ අයදුම්පත අවලංගු වීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත්, කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

14. රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා පමණි. මෙම ආයතනයේ නියුක්ත බව ද, ඔහුගේ වැඩ හා හැසිරීම සතුටුදායක බව ද, තනතුර සඳහා තෝරා ගතහොත් දැනට දරන තනතුරෙන් ඔහු නිදහස් කළ/ නොහැකි බව ද ප්‍රකාශ කරමි.

————,
ආයතන ප්‍රධානියාගේ
අත්සන.

දිනය :————.

09-265

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය

## ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය

## ක්‍රීඩා විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව - 2009/2010

ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය මගින් සිංහල භාෂාවෙන් පවත්වනු ලබන ක්‍රීඩා විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා වයස අවුරුදු 18-35 අතර අයැදුම්කරුවන්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ.

1. *සටහන* :- 01. දැනට රජයේ සේවයේ නියුක්තව සිටින්නන්ට වයස් සීමාව 45 ට නොවැඩි විය යුතු ය.

02. නියමිත ආකෘතිය ප්‍රකාරව සම්පූර්ණ නොකරන ලද අයැදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවේ.

2. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* :-

2.1 අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) පරීක්ෂණයේ දී දෙවතාවකට නොවැඩි පෙනී සිටීමකින් විෂයන් 06කින් සාමාර්ථය සහ එම විෂයයන් හයෙන් දෙකක් සිංහල හෝ දෙමළ සහ ගණිතය හෝ අංක ගණිතය විය යුතු ය.

2.2 තව ද ඔහු හෝ ඇය,

(අ) ක්‍රීඩා අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලේ පළමු, දෙවැනි හෝ තෙවැනි ස්ථාන ලබා තිබීම හෝ එම උළෙලේ දිස්ත්‍රික්ක මට්ටමේ තරගයක දී කේවල ඉසව්වක ප්‍රථම හෝ දෙවැනි ස්ථානය ලබා තිබීම හෝ කණ්ඩායම් තරගයක ප්‍රථම ස්ථානය ලබා තිබීම, හෝ

ජාතික ක්‍රීඩා සංගමයකින් පවත්වනු ලබන ජාතික මට්ටමේ තරගයක දී කේවල ඉසව්වක ප්‍රථම, දෙවැනි හෝ තෙවැනි ස්ථානය ලබා තිබීම හෝ කණ්ඩායම් තරගයක ප්‍රථම හෝ දෙවැනි ස්ථාන ලබා තිබීම, හෝ

ජාතික පාසැල් ක්‍රීඩා තරගාවලියේ වයස 16 න් ඉහළ කේවල තරගයක ප්‍රථම ස්ථානය දිනා තිබීම හෝ කණ්ඩායම් තරගයක ශූරතාවය දිනා තිබීම., හෝ

(ආ) ජාතික ක්‍රීඩා කණ්ඩායමක සාමාජිකයකු වශයෙන් දකුණු ආසියාතික, ආසියාතික ශූරතා, ආසියාතික, පොදු රාජ්‍ය මණ්ඩලීය, ලෝක කුසලාන, හෝ ඔලිම්පික් යන තරගයකට සහභාගී වී තිබීම.

හෝ

(ඇ) ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශයේ හෝ ඒ යටතේ ඇති ආයතනයක හෝ පළාත් සභාවක ක්‍රීඩා නිලධාරියෙකු හෝ නිලධාරිණියක වශයෙන් වසරක සේවයක් සම්පූර්ණ කර තිබීම හෝ අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්‍රීඩා ගුරුවරයෙකු හෝ ගුරුවරියක වශයෙන් පත්වීම් ලද දින සිට වසර 03 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම, හෝ

(ඈ) රජයේ පිළිගත් ආයතනයක ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ ගුරවරයෙකු, ගුරුවරියක, පුහුණුකරුවෙකු හෝ පුහුණුකාරිණියක (ස්වේච්ඡා වුවද විය හැක) වශයෙන් වසර 03 ක සේවා පළපුරුද්දක් සහිතව ජාතික ක්‍රීඩා සංගමයකින් ලබාගත් ක්‍රීඩා පුහුණු කිරීමේ අදියර හෝ බලපත්‍රයන් ලබා තිබීම සහ පාසැල් මට්ටමේ සුවිශේෂ ක්‍රීඩා දක්ෂතා පෙන්වා තිබීම, හෝ

(ඉ) ත්‍රිවිධ හමුදාවේ, පොලිසියේ හෝ සිවිල් ආරක්ෂක අංශයේ පුහුණු කිරීමේ ආයතනයක, ක්‍රීඩා හෝ ශාරීරික පුහුණු උපදේශකවරයකු/වරියක වශයෙන් මාස 06 කට නොඅඩු මූලික සහ උසස් පාඨමාලාවක් සාර්ථකව හදාරා සමත්වී තිබීම.

3. *අයැදුම්පත් එවීමේ ක්‍රමය* :-

3.1 ඉහත සඳහන් අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් හෝ අපේක්ෂිකාවන් විසින් මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ අයැදුම්පත්‍රය පරිදි "8 x 13 1/2" ප්‍රමාණයේ කඩදාසියක සකස් කර ගත් අයැදුම්පත් තම අත් අකුරින් සම්පූර්ණ කර 2009.10.12 වැනි දින හෝ ඊට පෙර අධ්‍යක්ෂ, ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය, අංක 100/7, නිදහස් මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

3.2 අයැදුම්පත බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ " 2009/2010 ක්‍රීඩා විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයැදුම්පත" යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

3.3 රජයේ, පළාත් පාලන සේවයේ, සංස්ථා සේවයේ නියුතු නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අයැදුම්පත්, අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය. එසේ නොවන අයැදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3.4 විභාග ගාස්තු වශයෙන් රු. 350 ක් ගෙවිය යුතු අතර, එම මුදල "ලේකම්, ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය" නමට මුදල් ඇණවුමක් මගින් අයැදුම්පත සමග එවිය යුතුය.

4. *තෝරා ගැනීම* :

මෙම පාඨමාලාව සඳහා ලැබෙන අයැදුම්පත් අතුරින් සුදුසුකම් සම්පූර්ණ කර ඇති සියලු දෙනා ලිඛිත පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, බඳවා ගැනීමේ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ලකුණු ලබාගත් අයැදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට හා ශාරීරික යෝග්‍යතා ප්‍රායෝගික පරීක්ෂණයකට කැඳවීමෙන් පසුව පාඨමාලාව සඳහා තෝරාගනු ලැබේ.

5. *පාඨමාලාව පිළිබඳ විස්තර* :

5.1 විෂය නිර්දේශය පහත සඳහන් පරිදි කොටස් 05 කින් යුක්තය.

(අ) පුහුණුවීමේ සාමාන්‍ය සිද්ධාන්ත (ශාරීරික ගුණාංග හා හැකියාවන්, තාක්ෂණ ක්‍රම, උපාය මාර්ග, පුහුණුවීම් ක්‍රම, සැලසුම් ක්‍රම, භාරය හා පරීක්ෂණ පිළිබඳ මූලධර්ම ආදී වශයෙනි) සහ වාචික පරීක්ෂණය,

(ආ) අවම වශයෙන් ක්‍රීඩා 10 ක් පිළිබඳ න්‍යායික හා ප්‍රායෝගික දැනුම,

(ඇ) ජවන හා පිටිය මලල ක්‍රීඩා පිළිබඳ විශේෂඥතාවය,

(ඈ) ජවන හා පිටිය මලල ක්‍රීඩාවලට අමතරව ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලා කාලය තුළ කාන්තා හෝ පිරිමි අය සඳහා අවස්ථානෝචිත පරිදි තෝරා ගන්නා ලද එක් ක්‍රීඩාවක් පිළිබඳ විශේෂඥතාවය (පාපන්දු/ වොලිබෝල්/ නෙට්බෝල්/ පැසිපන්දු)

(ඉ) ක්‍රීඩා ශාරීරික විද්‍යාව හා සමාජ විද්‍යාව, ක්‍රීඩා පරිපාලනය, ක්‍රීඩා උත්සව සංවිධාන ක්‍රම, ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව, ක්‍රීඩා රසායන විද්‍යාව, ක්‍රීඩා පෝෂණය සහ ක්‍රීඩා මනෝ විද්‍යාව වැනි පොදු විෂයයන් අධ්‍යයනය කිරීම.

5..2 පාඨමාලාවේ කාලසීමාව මාස 12 කි.

5..3 මෙම පාඨමාලාව සඳහා තෝරා ගනු ලබන, රැකියා විරහිත අයැදුම්කරුවන් විසින් රු. 15,000 ක මුදලක් ද, රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා හෝ පළාත් සභාවල රැකියාවන් හි නිරත අයැදුම්කරුවන් විසින් පෞද්ගලිකව හෝ ආයතනය මගින් රු. 30,000 ක මුදලක් ද, පාඨමාලා ගාස්තු වශයෙන් ගෙවිය යුතුය. එමෙන්ම මෙම මුදල චෙක්පතකින් ගෙවන්නේ නම් ආදායකයා ලෙස "ලේකම්, ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය" යනුවෙන් සටහන් කළ යුතුය. මෙම මුදල කුමන හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ.

5.4 පාඨමාලාව හැදෑරීම සඳහා තෝරාගනු ලබන අය, ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ නීති හා රෙගුලාසි පිළිපැදීමට බැඳී සිටිය යුතුය.

5.5 පාඨමාලාව සාර්ථකව නිම කරන අය සඳහා ක්‍රීඩා විද්‍යා ඩිප්ලෝමා සහතික පත්‍රය ප්‍රදානය කරනු ලැබේ.

6. *අනෙකුත් කොන්දේසි* :-

6.1 පාඨමාලාව අවසානයේ දී රැකියාවක් ලබාදීමට මෙම අමාත්‍යාංශය බැඳී නැත.

6.2 එසේකුදු වුවත්, පාඨමාලාව හදාරන්නන් විසින් ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ සමග ගිවිසුමකට එළඹිය යුතු යැයි මෙම අමාත්‍යාංශය අදහස් කරන්නේ නම්, එම ගිවිසුමට එළඹීමට පාඨාමාලාව හදාරන්නන් බැඳී සිටිය යුතුය.

6.3 පවතින ඉහළම සුදුසුකම් හෝ ඉල්ලා ඇති සුදුසුකම් අයැදුම්පතෙහි සඳහන් කළ යුතු අතර සඳහන් නොකරන ලද දත්ත පසුව ඉදිරිපත් කළ ද බාරගනු නොලැබේ.

6.4 මෙහි ආවරණය නොවන අනිකුත් කරුණක් වේ නම්, ඒ සම්බන්ධයෙන් ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ, සිය අභිමතය පරිදි කටයුතු කරනු ඇත.

එස්. ලියනගම,
ලේකම්.

2009 අගෝස්තු මස 24 වැනි දින,
ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශයේ දී ය,
7ඒ, රීඩ් මාවත,
කොළඹ 07.

**ආදර්ශ අයැදුම්පත්‍රය**

ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව - 2009/2010 වර්ෂය
ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය

01. (i) සම්පූර්ණ නම :————. මයා/මිය/මෙනවිය.

(ii) මුලකුරු සමග නම :————.

(iii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

(iv) ජාතික හැඳුනුම්පත් අංකය :————.

02. ලිපිනය (i) පෞද්ගලික :————.

(ii) කාර්යාලීය :————.

03. (i) උපන් දිනය :

වර්ෂය [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

(ii) 2009 දිනට වයස: වර්ෂ [ ][ ] මාස [ ][ ] දින [ ][ ]

04. ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? නැති ද? යන වග :————.
පුරවැසියෙක් නම්, ලියාපදිංචි වීමෙන් ද? පරම්පරාවෙන් ද? යන වග :————.

05. (i) ස්ත්‍රී/පුරුෂ භාවය :————.

(ii) විවාහක/අවිවාහක බව :————.

06. ඔබ රැකියාවක් කරයි ද? /නොකරයි ද? යන වග :

(i) සේවා ස්ථානය :————.

(ii) දැනට දරන තනතුර :————.

(iii) රැකියාවේ සේවා කාලය :————.

07. ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් :

| *වර්ෂය* | *විභාගය* | *විෂයයන්* | *ලබා ඇති සාමාර්ථයන්* |
|---|---|---|---|
| | | | |

08. ක්‍රීඩා දක්ෂතාවයන් (ලබා ඇති ඉහළම ක්‍රීඩා සහතික හා විශේෂ දස්කම් පිළිබඳ මෙහි සටහන් කරන්න) :————.

09. (i) ගැසට් නිවේදනය අනුව ඔබ මෙම පාඨමාලාවට සුදුසුකම් ලබන්නේ ඉහත 2.2 ඡේදයේ අ, ආ, ඇ, ඈ, ඉ දක්වා වන ඡේදවලින් කුමන ඡේදය යටතේ ද? :————.

(ii) අදාල ඡේදය යටතේ ඔබ ලබා ඇති ක්‍රීඩා සුදුසුකම් විස්තර සහිතව සඳහන් කරන්න. :————.

10. වෙනත් කරුණු :————.

11. මෙම පාඨමාලාවට තෝරාගනු ලැබුවහොත්, රු. 15,000 ක හෝ රු. 30,000 ක මුදලක්, පාඨමාලා ගාස්තු වශයෙන් ගෙවීමට ඔබ සූදානම් ද යන වග :————.

මෙහි ඉහත මා විසින් දක්වා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මම සහතික කරමි. මෙම තොරතුරු අසත්‍ය හෝ වැරදි හෝ බව යම්කිසි අයුරකින් සොයාගනු ලැබුවහොත් මෙම පාඨමාලාව හැදෑරීමට නුසුදුස්සකු වන බව හා පුහුණු පාඨමාලාවෙන් ඉවත් කරනු ලබන බව මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

**රජයේ පළාත් පාලන සේවයේ හා සංස්ථා සේවයේ නියුක්ත වූවන් සඳහා පමණි**

අධ්‍යක්ෂ,
ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය.

මෙම......... සේවය කරන...... වන ......... මහතා/මහත්මිය/මෙනවිය ගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරන අතර, මෙම අයදුම්කරු ඉහත පාඨමාලාව සඳහා තෝරාගනු ලැබුවහොත් පාඨමාලා කාලය සඳහා ඔහුව/ඇයව සේවයෙන් නිදහස් කළ හැකි බවට සහතික කරමි.

————.
සහතික කරන නිලධාරියාගේ අත්සන.

නිල මුද්‍රාව :————.

නම :————.
තනතුර :————.

දිනය :————.

09-250

---

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

ඉස්ලාමීය දීනියාත් (ධර්මාචාර්ය) සහතික පත්‍ර විභාගය - 2009

(බෞද්ධ ධර්මාචාර්ය සහතික පත්‍ර විභාගයට සමාන්තරව පවත්වන විභාගයකි)

*රෙගුලාසි හා උපදෙස් :*

1. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ඉහත සඳහන් විභාගය, 2009 නොවැම්බර් මාසය තුළ පැවැත්වීමට කටයුතු යොදා ඇත. එම විභාගය සඳහා වූ විෂය නිර්දේශ, ඇමුණුම 02හි සඳහන් වේ.

2. *විභාග මධ්‍යස්ථාන :*

එක් එක් දිස්ත්‍රික්කයෙන් පෙනී සිටීමට නියමිත අයදුම්කරුවන් සංඛ්‍යාව අනුව ඇමුණුම 01හි සඳහන් නගරවල විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ලැබේ.

එහෙත් යම්කිසි විභාග මධ්‍යස්ථානයකට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැතිවුවහොත් එම මධ්‍යස්ථානය අවලංගු කර එම අයදුම්කරුවන් ඊට ආසන්න වෙනත් විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ.

3. *භාෂා මාධ්‍යය :*

මෙම විභාගය දෙමළ, සිංහල, ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ. එහෙත් යම් අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලබන්නේ තමන් කැමති එක් භාෂා මාධ්‍යයකින් පමණි.

4. *සුදුසුකම් :*

මෙම විභාගය සඳහා අයදුම්කරන සෑම අයදුම්කරුවකුම පහත සඳහන් සුදුසුකම්වලින් එකක් හෝ 2006 වර්ෂයේ දී හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබිය යුතු ය.

4.1 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ඉස්ලාමීය දහම් පාසල් (අහදිය්යා/අල්කුර් ආන්) අවසාන විභාගයෙන් සමත් වී තිබීම,

4.2 මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අරාබි විද්‍යාලවලින් නිකුත් කරනු ලබන මවුලවි සහතිකයක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අල්-ආලිම් සහතික පත්‍ර විභාගයෙන් සමත් වී තිබීම

4.3 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අ. පො. ස (උ. පෙළ) විභාගයේ ඉස්ලාම් හෝ ඉස්ලාමීය ශිෂ්ඨාචාරය යන විෂයයන් දෙකෙන් එකක් ද ඇතුළුව විෂයයන් තුනකින් සමත් වී තිබීම.

4.4 ඉස්ලාම් විෂයයේ සම්මාන සාමාර්ථයක් සහිතව අ. පො. ස. (සා/පෙළ) විභාගය සමත් අහදිය්යා පාසලක හෝ අරාබි විදුහලක හෝ අවුරුදු දෙකකට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති ආචාර්යවරයෙකු වීම.

*සටහන*.- (1) මෙම විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකුම ඉහත 4 වැනි ඡේදයේ සඳහන් කර ඇති සුදුසුකම් ලබා ඇති බවට මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව අනුමත කර අහදිය්යා දහම් පාසලක විදුහල්පතිවරයකු විසින් හෝ ජොෂ්ඨ අල්කුර් ආන් මද්රසා විදුහලක විදුහල්පතිවරයකු විසින් හෝ අරාබි විදුහලක විදුහල්පතිවරයකු විසින් හෝ සහතික කළ යුතුය.

(2) මෙම විභාගයට ලියාපදිංචි කර ඇති අහදිය්යා දහම් පාසලක විදුහල්පතිවරයකු මගින් හෝ ජොෂ්ඨ අල්කුර් ආන් මද්රසා විදුහලක විදුහල්පතිවරයකු විසින් හෝ අරාබි විදුහලක විදුහල්පතිවරයකු මගින් හෝ පමණක් අයදුම්පත ඉදිරිපත් කළ යුතු ය. **පෞද්ගලික අයදුම්කරුවන් ලෙස මෙම විභාගයට අයදුම් කළ නොහැකිය.**

5. ලියාපදිංචි කළ සියලුම අහදිය්යා දහම් පාසල්වලට හා අරාබි විදුහල්වලට ඉල්ලුම්පත් හා උපදෙස් පත්‍රිකා තැපැල් මගින් යවා ඇති අතර, එසේ නොලැබුණු ආයතන වෙතොත් විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට අයදුම්කරුවන් සංඛ්‍යාව සඳහන්

කර ලිපියක් 2009.09.18 වැනි දිනට පෙර එවීමෙන් ඉල්ලුම්පත් හා උපදෙස් පත්‍රිකා ලබාගත හැක.

5.1 සියලුම ඉල්ලුම්පත් පිටපත් දෙකකින් සකස් කර මුල් පිටපත විභාග දෙපාර්තමේන්තුවට එවිය යුතු අතර, අනෙක් පිටපත තම ආයතනයේ ගොනුකර තබා ගත යුතුය.

5.2 අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනය 2009.10.05 වැනි දින වේ.

5.3 ඉල්ලුම්පත් පැහැදිලිව හා නිවැරදිව සම්පූර්ණ කළ යුතු වේ. එසේ නොවන ඉල්ලුම්පත් හා අවසාන දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.4 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතු වේ.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

(ඉල්ලුම්පත් ලැබුණ බව දැනුම් දෙනු නොලැබේ)

5.5 ඉල්ලුම්පත් බහා එවනු ලබන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "ඉස්ලාමීය දීනියාත් (ධර්මාචාර්ය) සහතික පත්‍ර විභාගය - 2009" යනුවෙන් හා ඉල්ලුම්කරන විභාග නගරය ද සඳහන් කළ යුතුය.

5.6 ඉල්ලුම්පත්‍ර සමග කිසිදු සහතිකයක් අමුණා එවිය යුතු නැත. අහදිය්යා දහම් පාසලේ හෝ අරාබි විදුහලක විදුහල්පති හෝ ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය නියමිත සුදුසුකම් ලබා ඇති බව සහතික කළ යුතුය.

6. පළමුවනවරට මෙම විභාගයට පෙනී සිටින අයදුම්කරුවන්ගෙන් විභාග ගාස්තු අයකරනු නොලැබේ. පළමුවනවරට පසු පෙනී සිටින අයදුම්කරුවන් විභාග ගාස්තු වශයෙන් රුපියල් 140/-ක් (එකසිය හතලිහක්) ගෙවිය යුතුය. ඌන සාමාර්ථය ලැබූ එක් විෂයයකට පමණක් පෙනී සිටින අයදුම්කරුවන් එම විෂය වෙනුවෙන් රු. 35/- (තිස් පහක්) ගෙවිය යුතු ය.

*විභාග ගාස්තු ගෙවන ආකාරය :*

6.1 නියමිත මුදල විභාග දෙපාර්තමේන්තුවේ ආදායම් ශීර්ෂ 2003-20-13 ට බැරවන සේ තැපැල් කාර්යාලයකට මුදල් ගෙවා ලබාගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුය. (ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත)

7. *විභාග ප්‍රවේශ පත්‍ර :*

විභාග ප්‍රවේශ පත්‍ර, විභාග කොමසාරිස් ජනරාල් විසින් අදාළ අහදිය්යා පාසලේ විදුහල්පති මගින් හෝ අරාබි විදුහලේ විදුහල්පති මගින් හෝ නිකුත් කරනු ලැබේ.

7.1 යම්කිසි විභාග අයදුම්කරුවකු විභාගයට පෙනී සිටින පළමුවන දිනයේ තම අත්සන සහතික කරවා ගත් විභාග ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් හෝ විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද විභාග මධ්‍යස්ථානය හැර වෙනත් මධ්‍යස්ථානයක විභාගයට පෙනී සිටීමට තැත් කළහොත් අදාළ අයදුම්කරුගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

7.2 විභාග ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන අහදිය්යා දහම් පාසලේ විදුහල්පති හෝ අරාබි විදුහලේ විදුහල්පති විසින් සහතික කළ යුතුය.

8. *පෞද්ගලික අනන්‍යතාව තහවුරු කිරීම :*

සියලුම අයදුම්කරුවන් විභාගයට පෙනී සිටින සෑම අවස්ථාවක දීම විභාග ශාලාධිපති සෑහීමට පත්වන ආකාරයට තමන්ගේ අනන්‍යතාව සහතික කිරීම සඳහා පහත සඳහන් ඒවායින් එකක් ඉදිරිපත් කළ යුතුය.

(අ) ජාතික හැඳුනුම්පත

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

9. *විභාග ප්‍රතිඵල නිකුත් කිරීම හා සාමාර්ථ්‍යය තීරණය කිරීම :*

9.1 මෙම විභාගයට අදාළ විෂයයන් පහෙන් ම එක්වර සමත් වන්නන් විභාගය සමත් වන්නන් ලෙස සැලකේ. ඔවුන්ට ඉස්ලාමීය ධර්මාචාර්යවරුන් සඳහා වන දීනියාත් සහතිකය පිරිනැමේ.

9.2 එක් විෂයකට පමණක් 25 ට නොඅඩු ලකුණු ලබා අනෙක් විෂයයන් හතරෙන් සමත් අය ඌන සාමාර්ථය (Referred) ලබා ඇති අය ලෙස සැලකේ. එසේ ඌන සාමාර්ථය ලබන අයදුම්කරුවන් ඊළඟ අනුගාමී විභාග වාර තුනක් තුළ අදාළ විෂයයට පෙනී සිට සමත් වීමෙන් උක්ත සහතිකයට හිමිකම් ලබයි. මෙම ඌන සාමාර්ථය ලැබූ විෂයයට නැවත පෙනී සිටීමට අයදුම් කිරීමේදී, අනෙකුත් විෂයයන්ට පෙනී සිටි වර්ෂය සහ විභාග අංකය ද පෙනී සිටි විෂයන්ට ලබා ගත් ශ්‍රේණි ද සඳහන් කළ යුතුය.

10. *විභාග පිළිබඳ විස්තර :*

මෙම විභාගය ප්‍රශ්නපත්‍ර පහකින් (05) යුක්ත ය. එක් එක් ප්‍රශ්න පත්‍රයට අදාළ කාලය පැය තුනක් (03) බැගින් වේ. එම ප්‍රශ්ණ පත්‍ර පහත දැක්වේ

1. අකීදා හා මසාදිරුෂ් ෂරීආ (ඉස්ලාමීය මූලධර්මය හා නීති මූලාශ්‍ර)
2. අල් ෆික්හුල් ඉස්ලාම් (ඉස්ලාමීය නීති පද්ධතිය)
3. අස්සීරා වත්තාරීකුල් ඉස්ලාම් (සීරා සහ ඉස්ලාමීය ඉතිහාසය)
4. සමාජ ජීවිතය හා ආචාරධර්ම (අල් අඛ්ලාක් වස්සුලූක්)
5. ඉස්ලාමීය සාහිත්‍යය සහ අරාබි බස (අල්ලුකතුල් අරබිය්යා වල් අදබුල් ඉස්ලාම්)

එක් එක් විෂයයට අදාළ විෂය අන්තර්ගතය මෙම දැන්වීමේ ඇමුණුම - 02 හි දක්වා ඇත.

11. *ප්‍රශ්න පත්‍රයෙහි ව්‍යුහය :*

* එක් එක් ප්‍රශ්න පත්‍රය, I වැනි කොටස , II වැනි කොටස සහ III වැනි කොටස යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

* I වැනි කොටසෙහි කෙටි පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න 10 ට ම පිළිතුරු සැපයිය යුතු වේ. එක් එක් ප්‍රශ්නයට ලකුණු හතරක් (04) බැගින් ලැබේ. (ලකුණු 4x10=40)

නිදසුන - එදිනෙදා කටයුත්තක් ඔබ ඉබාදතයක් කර ගන්නේ කෙසේ ද ? (ලකුණු 04)

* II වැනි කොටසෙහි ව්‍යුහගත ප්‍රශ්න පහකින් සමන්විත වේ. ඉන් කැමති ප්‍රශ්ණ හතරකට (04) පිළිතුරු සැපයිය යුතු ය. එක් එක් ප්‍රශ්නයකට ලකුණු 12 ක් බැගින් හිමි වේ. (ලකුණු 12x4=48)

* III වැනි කොටසෙහි රචනා වර්ගයේ ප්‍රශ්න දෙකක් (02) අඩංගු වේ. ඉන් කැමති එක් ප්‍රශ්නයකට පිළිතුරු සැපයිය යුතුය. මෙම කොටස සඳහා ලකුණු 12 ක් හිමි වේ. (ලකුණු 12x1=12)

12. සාමාර්ථ්‍යයතාව තීරණය කිරීමේ නිර්ණායක :

* එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු සියයක් (100) ක් බැගින් හිමි වේ.

* සාමාර්ථ්‍යය ලැබීමට එක් එක් විෂයයෙන් අවම වශයෙන් ලකුණු හතලිහක් (40) බැගින් ලබා ගත යුතු ය.

| | | |
|---|---|---|
| (අ) | ලකුණු 00 - 24 තෙක් | F |
| (ආ) | ලකුණු 25 - 39 තෙක් | W |
| (ඇ) | ලකුණු 40 - 54 තෙක් | S |
| (ඈ) | ලකුණු 55 - 64 තෙක් | C |
| (ඉ) | ලකුණු 65 - 74 තෙක් | B |
| (ඊ) | ලකුණු 75 - 100 තෙක් | A |

13. ප්‍රතිඵල නැවත සමීක්ෂණය :

විභාග ප්‍රතිඵල නිකුත් වී දින 30 ක් ඇතුළත ප්‍රතිඵල නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් කළ හැකිය. විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රයක් මගින්, නියමිත ගාස්තු ගෙවා අදාළ ආයතනයේ විදුහල්පති මගින් ඒ සඳහා ඉල්ලුම් කළ යුතු ය. විභාග ප්‍රතිඵලවල වෙනසක් සිදුවුවහොත් පමණක් ගාස්තු ආපසු ගෙවනු ලැබේ. කවර හෝ හේතුවක් මත ඉල්ලුම්කරුට හෝ ඔහුගේ/ඇයගේ නියෝජිතයකුට හෝ උත්තර පත්‍ර නිරීක්ෂණයට අවසර දෙනු නොලැබේ.

14. ඉහත සඳහන් කොන්දේසි හා උපදෙස්වලට අනුකූලව කටයුතු කිරීමට සියලුම අයදුම්කරුවන් බැඳී සිටින අතර, මෙහි සඳහන් නොවූ කරුණු සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි ක්‍රියා කරනු ලැබේ.

අනුර එදිරිසිංහ,
විභාග කොමසාරිස් ජනරාල්.

2009 අගෝස්තු මස 13 වැනි දින,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

ඇමුණුම - 1

විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර

| දිස්ත්‍රික්ක අංකය | නගර අංකය |
|---|---|
| 1. කොළඹ දිස්ත්‍රික්කය | |
| මධ්‍යම කොළඹ | 01 |
| බම්බලපිටිය | 02 |
| 2. ගම්පහ දිස්ත්‍රික්කය | |
| තිහාරිය | 03 |
| මාබෝල | 04 |
| මීගමුව | 05 |
| 3. කළුතර දිස්ත්‍රික්කය | |
| කළුතර | 06 |
| අලුත්ගම | 07 |
| 4. ගාල්ල දිස්ත්‍රික්කය | |
| ගාල්ල | 08 |
| 5. මාතර දිස්ත්‍රික්කය | |
| මාතර | 09 |
| 6. හම්බන්තොට දිස්ත්‍රික්කය | |
| හම්බන්තොට | 10 |
| 7. කෑගල්ල දිස්ත්‍රික්කය | |
| වරකාපොළ | 11 |
| මාවනැල්ල | 12 |
| 8. කුරුණෑගල දිස්ත්‍රික්කය | |
| කුලියාපිටිය | 13 |
| කුරුණෑගල | 14 |
| ගල්ගමුව | 15 |
| 9. පුත්තලම දිස්ත්‍රික්කය | |
| හලාවත | 16 |
| පුත්තලම | 17 |
| කල්පිටිය | 18 |
| 10. අනුරාධපුර දිස්ත්‍රික්කය | |
| අනුරාධපුරය | 19 |
| කැකිරාව | 20 |
| ගලෙන්බිඳුනු වැව | 21 |
| 11. පොළොන්නරුව දිස්ත්‍රික්කය | |
| කඳුරුවෙල | 22 |
| 12. මාතලේ දිස්ත්‍රික්කය | |
| මාතලේ | 23 |
| 13. මහනුවර දිස්ත්‍රික්කය | |
| මහනුවර | 24 |
| නාවලපිටිය | 25 |
| අකුරණ | 26 |
| 14. නුවරඑළිය දිස්ත්‍රික්කය | |
| නුවරඑළිය | 27 |
| 15. රත්නපුර දිස්ත්‍රික්කය | |
| බලන්ගොඩ | 28 |
| 16. බදුල්ල දිස්ත්‍රික්කය | |
| බදුල්ල | 29 |
| වැලිමඩ | 30 |
| 17. මොණරාගල දිස්ත්‍රික්කය | |
| බිබිල | 31 |

| දිස්ත්‍රික්ක අංකය | නගර අංකය |
|---|---|
| 18. අම්පාර දිස්ත්‍රික්කය | |
| සම්මන්තුරෙ | 32 |
| කල්මුනේ | 33 |
| අක්කරෙපත්තු | 34 |
| 19. මඩකලපුව දිස්ත්‍රික්කය | |
| කාත්තන්කුඩි | 35 |
| එරාවූර් | 36 |
| වාලෙච්චේනෙ | 37 |
| 20. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය | |
| ත්‍රිකුණාමලය | 38 |
| මුතූර් | 39 |
| කින්නියා | 40 |
| 21. වවුනියා දිස්ත්‍රික්කය | |
| වවුනියා | 41 |
| 22. මන්නාරම් දිස්ත්‍රික්කය | |
| මන්නාරම | 42 |
| 23. මුලතිව් දිස්ත්‍රික්කය | |
| මුලතිව් | 43 |
| 24. කිලිනොච්චි දිස්ත්‍රික්කය | |
| කිලිනොච්චි | 44 |
| 25. යාපනය දිස්ත්‍රික්කය | |
| යාපනය | 45 |

ඇමුණුම - 2

01. අකීදා හා මසාදිරුෂ් ෂරීආ

1.1 ඉස්ලාමීය අකීදා
1.1.1 ඉස්ලාමීය අකීදා - හැඳින්වීම හා සාමාන්‍ය අවබෝධය
1.1.2 ඉස්ලාමීය අකීදා හි අන්තර්ගතය
1.1.2.1 තව්හිද්
- අල් උලූහියියා
- අල් රුබූබියියා
- අස්මාඋල් හුස්නා තුළින් අල්ලාහ්ගේ ස්වභාව අවබෝධ කර ගැනීම
1.1.2.2 රූහානියියාත්
1.1.2.3 නුබුව්වත්
1.1.2.4 සම්ඉයියාත්
1.1.2.5 කලා කද්ර්

1.1.3 අකීදා ආශ්‍රිත කොටස්

1.2 මසාදිරුෂ් ෂරීආ

1.2.1 මසාදිරුන් නක්ලියියා - හැඳින්වීම
1.2.2 වහි
- වහි හි අවශ්‍යතාව
- වහි වර්ග
1.2.3 අල් කුර්ආන්
1.2.3.1 - පහළවීම හා ගොනු කරනු ලැබීම
- තර්තීබ් නුසුල්, තර්තීබ් තිලාවත්
1.2.3.2 - ව්‍යුහය
- මක්කි, මදනි
- නාසික් මන්සූන්
- මුහ්කම් - මුතෂාබිහ්
- අස්බාබුන් නුසුල්
1.2.3.3 - ඉඃජාසුල් කුර්ආන්
- භාෂාව පදනම් කරගත් මූලික
- නීති මූලික
- විද්‍යා මූලික
1.2.3.4 - තෆ්සීර් විද්‍යාව
- ආරම්භය හා වර්ධනය
- තෆ්සීර් වර්ග (මන්කූල්, මඃකූල්, නූතන තෆ්සීර් වර්ග)
1.2.3.5 - අල්කුර්ආන් හා සම්බන්ධතාව
- අල්කුර්ආනයට ළඟාවන ආකාරය
- අල්කුර්ආනයේ පරමාර්ථ
- අල්කුර්ආනය හඳාරන ආකාරය

1.2.4 අස්සුන්නා

1.2.4.1 පදාර්ථය හා ව්‍යවහාරික විස්තර
1.2.4.2 නීති මූලාශ්‍රයන් වශයෙන් සුන්නාව
1.2.4.3 හදීස් සංරක්ෂණය
- නබි (සල්) තුමාගේ කාලය
- සහාබාවරුන්ගේ අවධිය
- තාබිඊන්වරුන්ගේ අවධිය
- තාබිඋත්තාබිඊන්වරුන්ගේ අවධිය
- නූතන අවධිය
1.2.4.4 හදීස් ආශ්‍රිතව බිහිවූ විද්‍යාවන් හා ඒවායේ ප්‍රතිඵල
- අස්මාඋර් රිජාල්
- ඉල්මුල් ජරාහ් වත්තාඃතීල්
- උසූලුල් හදීස්
1.2.4.5 - හදීස් අවබෝධ කර ගැනීම
- හදීස් සමස්ථ ජීවිතයටම මඟ පෙන්වීමක්
- හදීස් ග්‍රන්ථ
1.2.4.6 - හදීස් වෙත ළඟාවීම
- විවිධ ක්ෂේත්‍රවලට අදාළ හදීස් අවබෝධ කර ගැනීම (පරිසරය සංරක්ෂණය, සෞඛ්‍ය ආරක්ෂාව, ආර්ථිකය, විද්‍යාව)

1.2.5 සහායක මූලාශ්‍ර

1.2.5.1 ඉජ්තිහාද්
- පදාර්ථය හා ව්‍යවහාර විස්තරය
- ඉජ්තිහාදයේ අවශ්‍යතාව
- නීති ගුරුකුලයන් - (මද්රසතුල් අසර් මද්රසතුර් රඋයු)
1.2.5.2 මුජ්තහිද්වරුන්
- සුදුසුකම් හා වර්ග
- ඔවුනගේ දායකත්වය
- මද්හබ් බිහිවීම හා වර්ධනය
1.2.5.3 සහායක මූලාශ්‍ර
- යාන්ත්‍රණ හා යෙදවුම්
- ඉජ්මා, කියාස්, මස්ලහා මුර්සලා, උර්ෆ්, ෂරඋ, සාබිකා, ඉස්තිහ්සාන්, ඉස්තිස්හාබ්, කව්ලුල් සහාබා, සද්දුස් සරාඉ

02. අල් - ෆික්හුල් ඉස්ලාම්

2.1 ඉබාදත්
2.1.1 තහාරත් - නජීස් පිළිබඳ විස්තරය

2.1.2 ඉබාදත්
- පදාර්ථය හා ව්‍යවහාරය
- ඉබාදත් වර්ග හා එහි මූලධර්ම
- ඊමාන් හා ඉබාදතය අතර සබඳතාවය

2.2 මූලික ඉබාදතයන්

2.2.1 සලාතය
- වැදගත්කම
- වර්ග
- පිළිවෙත්
- ප්‍රයෝජන

2.2.2 සකාත්
- වැදගත්ම, පිළිවෙත්
- ප්‍රයෝජන
- සකාතය ආයතනගත කිරීමේ අවශ්‍යතාව
- සකාතුල් ෆිත්ර්

2.2.3 සව්මය
- වැදගත්කම, වර්ග
- පිළිවෙත්
- ප්‍රයෝජන

2.2.4 අල්හජ්
- වැදගත්කම
- පිළිවෙත්
- ප්‍රයෝජන

2.2.5 සෙසු ඉබාදතයන්

- සදකා, උම්රා
- තිලාවතුල් කුර්ආන්, තව්බා ඉස්තිඃපාර්
- දික්ර් අව්රාද්, දුආ
- කව්ෆ්, රජා, රිලා, තවක්කුල්, වරඋ, සුහ්ද්
- සියාරතුල් කුබූර්, කුර්බානීන්

2.3 මුආමලාත්

2.3.1 ඉස්ලාමීය ආර්ථිකය
- හැඳින්වීම
- සුවිශේෂ ලක්ෂණ

2.3.2 ඉපැයීම හා වියදම් කිරීම
- ඉපැයීමේ වැදගත්කම
- කෘෂිකර්මය (මුසාරආ - ඉහ්යාඋල් මමාත්)
- කර්මාන්ත

2.3.3 වෙළෙඳාම
- වැදගත්කම
- ඉස්ලාම් අනුමත කර ඇති වෙළඳාම් ක්‍රම
(සම්සරා බෛඋත් තක්සීද්, මුලාරබා, මුෂාරකා, මුරාබහා, ඉජාරා, රහ්න්)
- නූතන වෙළඳාම් ක්‍රම (අනෙකුත් වෙළඳාම් ක්‍රම හා සැසඳීම) නිදසුන් : බැංකු, රක්ෂණය

2.3.4 ඉස්ලාම්හි තහනම් (හරාම්) කර ඇති ව්‍යාපාර කටයුතු
- බාල කිරීම්, සඟවා තැබීම්, රැවැට්ටීම
- අල්ලස, සූදුව, පොළිය
- හරාම් වූ ද්‍රව්‍ය විකිණීම

2.4 මුනාකහාත්

2.4.1 නිකාහ්
- නිකාහ් පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ටි කෝණය
- නිකාහ් - නීති රීති
- බහු භාර්යා විවාහය

2.4.2 පවුල
- පවුල් ජීවිතයේ වැදගත්කම
- අඹු සැමි සබඳතා
- වගකීම් හා අයිතිවාසිකම්
- දරුවන් හදාවඩා ගැනීම පිළිබඳ උපදෙස් හා මඟ පෙන්වීම්
- පශ්චාත් හිමිකම්/දෙමාපියන් හා දූ දරුවන්ගේ වගකීම් හා අයිතිවාසිකම්

2.4.3 දික්කසාදය
- දික්කසාදය පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ටි කෝණය
- වර්ග හා පිළිවෙත්
- ඉද්දා විස්තරය - නීති රීති, නඩත්තුව

2.5 ජිනායාත්
2.5.1 ජිනායාත් - හැඳින්වීම

2.5.2 අපරාධ
- වර්ග
- වැරදිවලට පිළියම්

2.5.3 දඬුවම්
- දඬුවම් පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ටි කෝණය
- හුදූද්, කිසාස්, තඃසීර්
- කෆ්ෆාරා, ෆිද්යා

03. සීරා හා ඉස්ලාමීය ඉතිහාසය

3.1 ඉතිහාසය පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ටි කෝණය
- ඉස්ලාමීය ඉතිහාසයේ සුවිශේෂ ලක්ෂණ

3.2 ඉතිහාස අවධි

3.2.1 - නබි (සල්) තුමන්ගේ අවධිය
- නබි (සල්) තුමාට පෙර අවධිය
- නබි (සල්) තුමාගේ මක්කා ජීවිත කාල පරිච්ඡේදය
- නබි (සල්) තුමාගේ මදීනා ජීවිත කාල පරිච්ඡේදය

3.2.2 කුලෆාඋර්රාෂිදීන්වරුන්ගේ කාල පරිච්ඡේදය
- කලීෆාවරුන් තෝරා පත් වූ ආකාරය
- රාජ්‍ය විකාශයට තුඩු දුන් හේතූන් සහ විකාශ වූ ආකාරය
- පාලන, මූල්‍ය, අධිකරණ ආයතන
- මුහුණදුන් අභියෝග
- කලීෆාවරුන්ගේ පෞරුෂ ලක්ෂණ හා ආදර්ශ

3.2.3 පසු කාලීන කලීෆාවරුන්ගේ කාල පරිච්ඡේදය

3.2.3.1 උමයියා අවධිය
- උමයියාවරුන්ගේ පිබිදීම
- ප්‍රධාන කලීෆාවරු - පෞරුෂ ලක්ෂණ හා දායකත්වය (මුආවියා, අබ්දුල් මලික්, වලීද්, උමර් ඉබ්හු අබ්දුල් අසීස්)

- රාජ්‍ය විකාශය එහි ප්‍රතිඵල
- මුහුණදුන් ගැටළු

3.2.3.2 අබ්බාසිවරුන්ගේ කාල පරිච්ඡේදය
- අබ්බාසිවරුන්ගේ පිබිදීම
- ප්‍රධාන කලීෆාවරු හා දායකත්වය (මන්සූර්, හාරූන්, මඃමූන්)
- පසු කාලීන කලීෆාවරුන්ගේ පාලනය
- කුලෆාඋර්රාෂිදීන්වරුන්ගේ පාලනය හා සැසඳීම

3.2.3.3 අනෙකුත් රාජ්‍යයන්
- ස්පාඤ්ඤයේ උමයියා පාලනය
- ඉන්දියාවේ මෝගල් පාලනය
- තුර්කියෙහි උස්මානිය පාලනය

3.2.3.4 වර්තමාන මුස්ලිම් ලෝකය

3.3 ඉස්ලාමීය කලාවන්

3.3.1 විද්‍යාත්මක කලාවන්
- විද්‍යාත්මක කලාවන් පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ඨී කෝණය
- පහත දැක්වෙන කලාවන්හි වර්ධනය හා නිර්මාණාත්මක දායකත්වය : දර්ශනය, වෛද්‍ය විද්‍යාව, ඉතිහාසය, ගණිතය, භූගෝල විද්‍යාව, තාරකා විද්‍යාව

3.3.2 සෞන්දර්යාත්මක කලාවන්
- සෞන්දර්ය කලා පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ඨී කෝණය
- පහත දැක්වෙන කලාවන් බිහිවීම සහ වර්ධනය (කිරාඅත් කලාව, කැලිග්‍රාෆි අක්ෂර කලාව අරබෙස්ක්, වාස්තු විද්‍යාව, මිනියේචර් කලාව, සංගීත කලාව)

3.4 ඉස්ලාමීය ඉතිහාසයේ මස්ජිද්වල දායකත්වය

- මස්ජිද් බිහිවීම හා එහි කාර්යයන්
- පහත සඳහන් මස්ජිද් බිහිවීම හා ඒවායෙහි වැදගත්කම මස්ජිදුල් හරම්, මස්ජිදුන් නබවි, මස්ජිදුල් අක්සා

3.5 ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය

3.5.1 අරාබිවරුන්ගේ පැමිණීම
3.5.2 ශ්‍රී ලංකාවේ ඉස්ලාම් හඳුන්වා දෙනු ලැබීම
3.5.3 ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්
- ජනගහන විකාශය හා පැරණි සහ නව ජනාවාස
- ජාතික මට්ටමේ දායකත්වය
3.5.4 ආගමික හා සමාජීය ආයතන
- මස්ජිද්
- මුස්ලිම් පුද්ගල නීතිය
- වක්ෆු විවාහය බිඳීම පිළිබඳ නීති රීති
- ක්වාසි අධිකරණය හා අභියාචනා ක්වාසි සභාව
- මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

3.6 ඓතිහාසික මුස්ලිම් පෙර ගමන්කරුවන්

3.6.1 සහාබාවරුන් (මුස්අබ් ඉබ්නු උමෛර් (රලි), බිලාල් (රලි), සෛද් ඉබ්නු සබීද් (රලි), දුල් බිජාදෛන් (රලි), උම්මු අමාරා (රලි), අස්මා බින්ති අබුබක්කර් (රලි), ෆාතිමා (රලි)

3.6.2 තාබිඊන්වරුන්, ඉමාම්වරුන් (උමර් ඉබ්නු, අබ්දුල් අසීස්, සායිද් ඉබ්නු මුසෙයද්, අතා ඉබ්නු අබි රබාහ්, ඉමාම් සුහ්රි)

3.6.3 චින්තකයින්, ප්‍රතිසංස්කරණවාදීන් : අබ්දුල් කාදිර් ජිලිනි, ඉමාම් ගස්සාලී, අබුල් හසන් ෂාදුලි, ඉබ්නුල් කෙයුම් අල් ජව්සි

මුහම්මද් ඉබ්නු අබ්දුල් වහ්හාබ්, මෞලානා ඉල්යාස්, ඉමාම් හසනුල් බන්නා, මෞලානා මෞදූදි

04. සමාජ විද්‍යාව හා ආචාර් ධර්ම

4.1 සමාජ විද්‍යාව
4.1.1 හැඳින්වීම
- මිනිසා, විශ්වය, ජීවිතය පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ඨී කෝණය
4.1.2 පුද්ගලයා
- සමාජයේ පුද්ගලයාගේ දායකත්වය
- සමාජය කෙරෙහි පුද්ගලයාගේ වගකීම
4.1.3 පවුල
- පුද්ගලයා සහ පවුල
- මුස්ලිම් සමාජයීය ක්‍රමයේ පුද්ගලයාගේ කාර්ය භාරය
- පුද්ගලයා ගොඩනැංවීමෙහිලා පවුලේ දායකත්වය හා කාර්ය භාරය
- ඥාති සබඳතා
- ඥාතීන් හා අසල්වැසියන්
4.1.4 සමාජය
- ඉස්ලාමීය සමාජ ව්‍යුහයේ ලක්ෂණ (සමානාත්මතාවය, සහෝදරත්වය, නිදහස, යුක්තිය)
- පුද්ගලයා සහ සමාජය (අයිතිවාසිකම්)
- යහ ක්‍රියා වර්ධනය කිරීම, අයහපත් ක්‍රියා වැළැක්වීම
- ඉස්ලාමීය පුහුණුකරුවන්ගේ ලක්ෂණ හා කාර්යභාරය
- බහු වාර්ගික සමාජයෙහි මුස්ලිම්වරුන්ගේ සබඳතාව
- දුබලයන්ට ආරක්ෂාව
- ඒකියා සඳහා මාර්ගෝපදේශ
- සමාජ ආචාරධර්ම (ඉවසා දරා ගැනීම, නම්‍යශීලී බව, තවාසුන්, නායකත්වයට ගරු කිරීම, සමාජ සන්නිවේදනය)
- සමාජ සබඳතාව තහවුරු කරන හා දුර්වල කරන කරුණු

4.2 ආචාර් ධර්ම

4.2.1 - අල්ලාහ් සමඟ සබඳතා
- ඉහ්ලාස්
- තක්වා (දේව භක්තිය)
- තවක්කුල්
- අල්ලාහ්ගේ තීන්දුව හා කැමැත්ත සතුටින් භාර ගැනීම
- අල්ලාහ් කෙරෙහි දයාව දැක්වීම
- කෙළෙහිගුණ දැක්වීම

4.2.2 මිනිස් සබඳතා සමාජ ආචාරධර්ම
- සහෝදරත්වය
- සත්‍යවන්තභාවය
- අවංකභාවය
- සමාව දීමේ ආකල්පය
- පාරිශුද්ධභාවය/පිරිසිදුකම
- සෙනෙහස

- ලැජ්ජාශීලි බව
- ඉවසීම

4.2.3 අනෙකුත් ජීවීන් හා භෞතික වස්තූන් පිළිබඳ ආචාරධර්ම
- ජීවීන් කෙරෙහි ආදරය දැක්වීම හා ඔවුන්ගේ සුභ සිද්ධියට කටයුතු කිරීම
- භෞතික පරිසරය සුරැකීම
- රටේ යහපත සුරැකීම
- ආපදා කළමනාකරණය

05. ඉස්ලාමීය සාහිත්‍ය අරාබි බස

5.1 ඉස්ලාමීය සාහිත්‍ය

5.1.1 - ඉස්ලාමීය සාහිත්‍යයේ සංකල්ප හා මූලධර්ම
- නූතන ඉස්ලාමීය සාහිත්‍ය හැඳින්වීමක්

5.2 පහත දක්වා ඇති අය ඉස්ලාමීය සාහිත්‍යයට දැක්වූ දායකත්වය

දෙමළ භාෂා මාධ්‍යයෙන්

- එම්. සී. සිද්දි ලෙබ්බෙ
- ආචාර්ය එම්. එම්. උවයිස්
- ඒ. එම්. ඒ. අසීස්
- අමර් හස්රත්
- යූ. එම්. තාසිම්
- අබ්දුල් කාදර් ලෙබ්බෙ කවියා
- සිංහල භාෂාව තුළින්
- ආචාර්ය එම්. එම්. උවයිස්
- එස්. එම්. මන්සූර්
- ඒ. එම්. ෂාහුල් හමීද්
- එම්. එම්. එම්. ෂම්ස්
- එම්. ඒ. මුහම්මද් මාස්ටර් (දික්වැල්ල)
- මාතර කාසිම් කවියා

5.3 අරාබි දෙමළ

5.3.1 ආරබි දෙමළ - හැඳින්වීම
- ආරබි දෙමළ - ආරම්භය හා වර්ධනය

5.3.2 පහත කෘති පිළිබඳ අවබෝධය
- ෆක්හුද්දයියාත් - ආලිමුල් අරූස්
- තෆ්සීර් ජී ෂෙයිකු මුස්තාෆා (බේරුවල)
- ඉබ්නු නුෆාදාගේ කුත්බා
- මීසාන් මාලේ
- තලෙල ෆාතිහා
- තක්කසුරුක්

5.4 අරාබි බස

5.4.1 - භාෂා කුසලතා වර්ධනය
- සවන්දීම
- කථනය/කථා බහ
- කියවීම
- ලිවීම

5.4.2 එදිනෙදා ජීවිතයේ භාවිතා කළ හැකි වදන් හා වාක්‍යාංශ
- කෙටි වාක්‍ය

5.4.3 අරාබිය සිංහලට හෝ දෙමළට හෝ ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම හා සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි අරාබියට පරිවර්තනය කිරීම

5.4.4 දෙන ලද ඡේදයට අදාළව අසන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම
- දෙ ලද ඡේදයට පිල්ලම් යෙදීම

5.4.5 අල්කුර්ආන්, සුන්නා සාහිත්‍ය රස විඳීම
- මුෆ් රදාතුල් කුර්ආන්
- සිද්ධි වාචනය

5.4.6 අහ්කාමුත් දජ්වීද් - තජ්වීද් නීති රීති

5.4.7 ව්‍යාකරණ පිළිබඳ දැනුම

5.4.7.1 අස්සර්ෆු
- අතීත කාල වර්තමාන කාල ක්‍රියා
- උත්තම පුරුෂ, මධ්‍යම පුරුෂ, ප්‍රථම පුරුෂ ක්‍රියා
- ලිංග භේද, වචන භේද, බහු වචන ප්‍රභේද
- විධි ක්‍රියාව
- අතීත කාල වර්තමාන කාල, කර්ම කාරක ක්‍රියා
- ක්‍රියා මූල (මස්කර්)
- ඉස්මු ෆාඉල්/ඉස්මු මෆ්උෘල්
- බහු වචන විවිධත්වය

5.4.7.2 අන්නහ්වු
- අල් මුෆ්තදා, වල් කෆර්
- අල් ෆිඅල් වල් ෆා ඉල්
- අස්මාඋල් ඉෂාරා
- අස්සිෆාත්
- හුරූෆුල් ජර්රු
- අල් මුලාෆ් වල් මුලාෆ් ඉලයිහි
- කාන වඅකවාතුහා
- ඉන්න ව අකවාතුහා
- අල් හාල්

09-292

---

**වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය**

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
ආධුනිකත්ව අභ්‍යාස ආයතනය - මොරටුව

**ආධුනිකයන් බඳවා ගැනීම - 2010 ජනවාරි**

ශ්‍රී ලංකා ජර්මන් ඒකාබද්ධ ව්‍යාපෘතියක් වන මොරටුව ආධුනිකත්ව අභ්‍යාස ආයතනය සහ එහි අනුබද්ධිත ආයතනයක් වන දඹුල්ල ශ්‍රී සුමංගල NAITA මුද්‍රණ පාසල පහත දැක්වෙන පූර්ණ කාලීන පාඨමාලා සඳහා ශ්‍රී ලාංකීය තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. පවත්වනු ලබන පූර්ණ කාලීන පාඨමාලා :

| | පාඨමාලාවේ නම | ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) | කාලය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | කම්බි නැවුම් ශිල්පී | 3 වන මට්ටම | මාස 6 | 8 වන ශ්‍රේණිය සමත් වීම හෝ ඊට ඉහළ සුදුසුකම් |
| 02 | ගොඩනැගිලි පින්තාරු ශිල්පී | | අවු. 1 | |
| 03 | පෙදරේරු කාර්මික ශිල්පී | 4 වන මට්ටම | අවු. 2 | |
| 04 | ජලනල කාර්මික ශිල්පී | 4 වන මට්ටම | අවු. 2 | |
| 05 | ලී වැඩ කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ) | 4 වන මට්ටම | අවු. 2 | |
| 06 | ලී වැඩ කාර්මික ශිල්පී (ගොඩනැගිලි) | 4 වන මට්ටම | අවු. 2 | |
| 07 | දැව කැටයම් කාර්මික ශිල්පි (ගෘහ භාණ්ඩ) | | අවු. 2 | |
| 08 | මූලික පොත් බඳින්නා (දඹුල්ල සහ මොරටුව) | | අවු. 1 | |
| 09 | ශීතකරණ හා වායු සැකසුම් කාර්මික ශිල්පි | 3 වන මට්ටම | අවු. 2 | දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව සහ ගණිතය ඇතුලුව විෂයයන් 6කින් අ. පො. ස. (සා/පෙළ) සමත්වීම. |
| 10 | පෑස්සුම් ශිල්පි - Welder | 4 වන මට්ටම | අවු. 3 | |
| 11 | ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු (දඹුල්ල සහ මොරටුව) | 2 වන මට්ටම | අවු. 1 | |
| 12 | වැද්දුම්කරු (විශේෂ) - Fitter (Special) | | අවු. 3 | |
| 13 | යන්ත්‍රකරු (විශේෂ) - Machinist (Special) | | අවු. 3 | |
| 14 | විදුලි කාර්මික (විශේෂ) | | අවු. 3 | |
| 15 | ඉලෙක්ට්‍රොනික් කාර්මික (විශේෂ) | | අවු. 3 | |
| 16 | පරිගණක යෙදවුම් සහායක | 3 වන මට්ටම | අවු. 1 | දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුලුව විෂයයන් 6කින් අ. පො. ස. (සා/පෙළ) සමත් වීම |
| 17 | පරිගණක චිත්‍ර නිර්මාණ ශිල්පි | 4 වන මට්ටම | අවු. 1 1/2 | |
| 18 | ඉදිකිරීම් සුපරීක්‍ෂක | 4 වන මට්ටම | අවු. 1 1/2 | |
| 19 | ත්‍රිමාණ සජීවීකරණ ශිල්පී (3D Animation) | | අවු. 1 1/2 | දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුලුව විෂයයන් 6කින් අ. පො. ස. (සා/පෙළ) සමත් වීම සහ පරිගණක චිත්‍ර නිර්මාණ ශිල්පය පිළිබඳ දැනුමක් ලබා තිබීම. |

2. වයස : 2010.01.01 වැනි දිනට වයස අවුරුදු 16ට නොඅඩු 35ට නොවැඩි විය යුතුය.

3. පුහුණු කාලය තුළදී පැය 150 ක ඉංග්‍රීසි පාඨමාලාවක් නොමිලයේ හැදෑරීම සඳහා පහසුකම් සලසා ඇත.

4. පුහුණුව පිළිබඳ විස්තර :

4.1 සියලුම පාඨමාලා ද්විත්ව පුහුණු ක්‍රමය මත සැළසුම් කර ඇත. ඒ අනුව වෘත්තීය පුහුණුවේ පළමු භාගයේදී මූලික පුහුණුව ආයතනය තුළදී ලබාදේ. එම කාලය තුළ මාසික දීමනාවක් ආධුනිකයාට ලබාදේ. පුහුණුවේ දෙවන භාගයේදී වැඩිදුර පුහුණුව

සඳහා රාජ්‍ය සහ පෞද්ගලික ආයතන වල කර්මාන්තශාලාවලට අනුයුක්ත කරනු ලැබේ. පෙදරේරු කාර්මික ශිල්පී, ලී වැඩ කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ) හා පැස්සුම් ශිල්පී වැනි කාර්මික ශිල්ප සඳහා දේශීය හා විදේශීය රැකියා අවස්ථාවන් අතිශයින් වැඩි වී ඇත. පැස්සුම් ශිල්පී පාඨමාලාවේ දී පහත සඳහන් නවීන පැස්සුම් ශිල්පී ක්‍රම ද පුහුණු කරනු ලැබේ. (MMS/GAS/TIG/MIG/MAG/PLASMA)

4.2 ඉහත සඳහන් සියලුම පාඨමාලාවන් හි පුහුණුව අවසන් කිරීමෙන් පසුව පිරිනමනු ලබන සහතිකය, (වසර දෙකක පළපුරුද්දක් සමඟ) ඕස්ට්‍රේලියාවේ රැකියා අවස්ථාවන් සඳහා ප්‍රමුඛත්වය ලබාදෙන සහතිකයක් ලෙස පිළිගැනේ.

5. *තෝරා ගැනීමේ ක්‍රමය* :

5.1 සියලුම අයැදුම්කරුවන් පැය 1ක් වූ ලිඛිත අභියෝග්‍යතා පරීක්ෂණයකට කැඳවනු ලැබේ. මෙම පරීක්ෂණයෙන් සමත් වන අයැදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවා එහි දී ලබාගන්නා ලකුණු මත පාඨමාලාවන්ට බඳවා ගනු ලැබේ.

6. *අයැදුම්පත් එවිය යුතු ආකාරය* :

6.1 ඔබේ නම හා ලිපිනය ලියූ මුද්දර කවරයක් මෙම ආයතනයට එවීමෙන් හෝ ආයතනයට පැමිණීමෙන් හෝ ඉල්ලුම්පතක් ඔබට ලබාගත හැකිය. නැතිනම් දක්වා ඇති ආකෘතියට අනුව, අඟල් “11 1/2 x 8 1/4” (A4) ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කළ ඉල්ලුම් පතක් එවිය හැකිය.

6.2 ඔබගේ ඉල්ලුම්පත සමග මහජන බැංකුවේ කටුබැද්ද ශාඛාවේ “ගිණුම් අංක 313100153656984” ට බැර කරන ලෙස සඳහන් කරමින් ඕනෑම බැංකු ශාඛාවකට රු. 100 ක් ගෙවා ලබා ගත් ලදුපතෙහි ඡායා පිටපතක් සහ ඔබගේ ලිපිනය සඳහන් මුද්දර ගැසූ දිග ලියුම් කවරයක් 2009.09.30 දිනට පෙර, “අධ්‍යක්ෂ/විදුහල්පති, ආධුනිකත්ව අභ්‍යාස ආයතනය, අංක 581, ගාලුපාර, කටුබැද්ද, මොරටුව” යන ලිපිනයට යොමු කළ යුතුය.

6.3 ලිඛිත පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ මුදල් ගෙවූ ලදුපතෙහි ඡායා පිටපතක්, එවා ඇති අයැදුම්කරුවන් පමණි.

6.4 එක් අයැදුම්කරුවෙකු තමන් කැමති පාඨමාලා තුනක නම් ප්‍රමුඛතාවය අනුව ඉල්ලුම්පතේ සඳහන් කළ යුතුය.

6.5 ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ පූර්ණ කාලීන පාඨමාලාවක් දැනට හදාරණ අයට මේ සඳහා අයැදුම්කළ නොහැක.

6.6 අයැදුම්පත්‍රය ලබා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ “ආධුනිකයන් බඳවා ගැනීම 2010 ජනවාරි” යන්න සඳහන් කළ යුතුය.

7. තැපැලේ දී නැතිවන හෝ ප්‍රමාදවන අයැදුම්පත් සම්බන්ධයෙන් ආධුනිකත්ව අභ්‍යාස ආයතනය වග කියනු නොලැබේ. ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා සම්පූර්ණ කරන ලද අයැදුම්පත් කල් ඇතිව ඉදිරිපත් කරන මෙන් දන්වා සිටිනු ලැබේ.

සභාපති,<br>ජාතික ආධුනිකත්වය සහ<br>කාර්මික පුහුණු කිරීම් අධිකාරිය.

(ආදර්ශ අයැදුම්පත්‍රය (11 1/2" x 8 1/4" (A4) ප්‍රමාණයේ)

*ආධුනිකත්ව අභ්‍යාස ආයතනය - මොරටුව*

ආධුනිකයන් බඳවා ගැනීම - 2010 ජනවාරි

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.

1. අයැදුම්කරුගේ සම්පූර්ණ නම :————. මයා/මිය/මෙනෙවිය.
2. මුලකුරු සමග නම :————.
3. ලිපිනය :————.
4. පදිංචිය :
   (i) ග්‍රාම සේවා වසම :————.
   (ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
   (iii) ඡන්ද කොට්ඨාසය :————.
   (iv) දිස්ත්‍රික්කය :————.

5. දුරකථන අංකය :————.
6. මුදල් ගෙවන ලද ලදුපතෙහි අංකය :————.
7. උපන් දිනය :————.
8. ජාතික හැඳුනුම්පත් අංකය :————.
9. ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම් :

අ. පො. ස. (සා/පෙළ) ප්‍රතිපල -

*විභාග අංකය* *වර්ෂය*

————. ————.
————. ————.

| *විෂයයන්* | *සාමාර්ථය* | *වර්ෂය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

10. ඔබගේ සුදුසුකම් අනුව හැදෑරීමට කැමති පාඨමාලා තුනක නම් ප්‍රමුඛතාවය අනුව සඳහන් කරන්න.

1. ————.
2. ————.
3. ————.

ඉහත සඳහන් විස්තර සත්‍ය බවට සහතික කරමි.

————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :————.

09-354

---

## උපතැපැල් ස්ථානාධිපති බඳවා ගැනීමේ තරග විභාගය - 2009

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* 2009.07.17 දින පළකරන ලද උපතැපැල් ස්ථානාධිපතිවරුන් බඳවා ගැනීමේ තරග විභාගයේ පුරප්පාඩු කාර්යාල පිළිබඳ මෙහි පහත සංශෝධන කරනු ලැබේ. පහත සඳහන් කාර්යාලවල පුරප්පාඩු නොමැති බව දන්වන අතර, අයැදුම්පත් ඉදිරිපත් කර ඇති අයැදුම්කරුවන් වෙත මුදල් ආපසු ගෙවනු ලැබේ.

| උපතැපැල් කාර්යාලයේ නම | | ප්‍රාදේශීය තැපැල් අධිකාරි කොට්ඨාශය |
|---|---|---|
| 01. | කුඩහකපොල | ගම්පහ |
| 02. | මෝදර දකුණ | කොළඹ |
| 03. | ඌව උඩුනුවර | බදුල්ල |
| 04. | අළුත්නුවර | කෑගල්ල |
| 05. | බෝරුක්ගමුව | කෑගල්ල |
| 06. | කෙහෙල්පන්නල | කෑගල්ල |
| 07. | විජය ශ්‍රී ගම | මහනුවර දකුණ |
| 08. | හඳගනාව | මහනුවර දකුණ |
| 09. | මහසෙන්පුර | අනුරාධපුරය |
| 10. | පානම | අක්කරෙයිපත්තු |
| 11. | වේමමාඩු කුලම් | වව්නියා |
| 12. | පාලම්මොඩ්ඩෙයි | වව්නියා |
| 13. | කන්නාට්ටි | වව්නියා |

එම්.කේ. බී. දිසානායක,
තැපැල්පති.

2009 අගොස්තු මස 06 වැනි දින,
තැපැල් මූලස්ථානය,
අංක 310, ඩී.ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 01000.

09-388

---

**අධ්‍යාපන අමාත්‍යාංශය**

ගුරු අධ්‍යාපනය පිළිබඳ පූර්ව සේවා වෘත්තීය පාඨමාලාවක් හැදෑරීම සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ඇතුළත් කර ගැනීම - 2010

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක ගුරු අධ්‍යාපනය පිළිබඳව තුන් අවුරුදු පූර්ව සේවා වෘත්තීය පාඨමාලාවක් හැදෑරීමට අවශ්‍ය ශාස්ත්‍රීය සුදුසුකම් හා යෝග්‍යතාවය ඇති අයැදුම්කරුවන්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ.

02. *යෝග්‍යතාවය* :

*සෑම අයැදුම්කරුවකුම-*

2.1 ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුයි.

2.2 විශිෂ්ට චරිතයකින් ද, මනා ශාරීරික හා මානසික සෞඛ්‍යයෙන් ද යුක්ත විය යුතුය.

2.3 *වයස* :

2.3.1. 2010.01.01 දිනට වයස අවුරුදු 25 ට නොවැඩි විය යුතුය.

2.3.2 කතෝලික/ක්‍රිස්තියානි ධර්මය පාඨමාලාවට අයදුම්කරන පූජකවරුන් සඳහා 2010.01.01 දිනට වයස අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

2.3.3 බුද්ධ ධර්මය පාඨමාලාවට ඉල්ලුම් කරන බෞද්ධ භික්ෂූන් වහන්සේලා/මෙහෙණින් වහන්සේලා 2010.01.01 දිනට වයස අවුරුදු 27ට නොවැඩි විය යුතුය.

2.4 අවිවාහක විය යුතුය.

3.0. *මූලික අධ්‍යාපන සුදුසුකම්* :

3.1 2008 වර්ෂයේ පවත්වන ලද අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී විෂයයන් තුනකින් (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා විෂයයන් දෙකකින්) එකවර සමත් වීම.

(තාක්ෂණ අධ්‍යයන පාඨමාලාවේ ඉල්ලුම්කරුවන් 4.13 ඡේදයේ සැලකිය යුතුයි යන වගන්තිය ද කතෝලික/ක්‍රිස්තියානි ධර්මය පාඨමාලාවේ පූජකවරුන් 4.10 ඡේදයේ සැලකිය යුතුයි යන වගන්තිය ද කියවන්න.)

3.2 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී/මූලික පිරිවෙන් අවසාන විභාගයේදී ගණිතය, සිංහල/දෙමළ භාෂාව ඇතුළු හර විෂයයන් හයකින් (06) දෙවරකට නොවැඩි වාර ගණනක දී සම්මාන තුනක් (03) සහිතව සමත්වීම. (පළමු අවස්ථාවේ දී අවම වශයෙන් හර විෂයයන් පහකින් (05) සමත් විය යුතුය).

3.3 ඒ ඒ පාඨමාලාවට අදාළ අ.පො.ස (සා.පෙළ) විභාගයේ විශේෂ සුදුසුකම් ඉහත 3.2 පරිදි දෙවරක දී සම්පූර්ණ නොවේ නම් තුන්වැනි වාරයේ දී සම්පූර්ණ කර තිබිය යුතුය. (විශේෂ සුදුසුකම් පිළිබඳව සලකා බලනු ලබන්නේ 3.1 හා 3.2 හි සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගේ පමණි.) විශේෂ සුදුසුකම් පිළිබඳව විශේෂයෙන් සඳහන් කර නොමැති විටෙක 3.1 හා 3.2 හි සඳහන් සුදුසුකම් සලකා බලනු ලැබේ.

3.4 ඉංග්‍රීසි භාෂාව පාඨමාලාව හා ඉංග්‍රීසි මාධ්‍ය පාඨමාලා සඳහා ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය.

3.4.1. ඉංග්‍රීසි භාෂාව පාඨමාලාව හැර ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වෙන අනෙකුත් පාඨමාලාවලට ඉල්ලුම්කරන අයදුම්කරුවන් අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබිය යුතු වේ.

3.4.2 ඉංග්‍රීසි භාෂාව පාඨමාලාව සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන් අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට අධි සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු වේ. අ.පො.ස. (උ. පෙළ) ඉංග්‍රීසි භාෂාව විෂයක් වශයෙන් සමත්ව ඇති අයදුම්කරුවන් අ.පො.ස (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම ප්‍රමාණවත් වේ. කෙසේ වුවද ප්‍රවීණතා පරීක්ෂණයේදී සමාන ලකුණක් ලබා ඇති අයදුම්කරුවන් කීප දෙනෙකු අතරින් එක් අයෙක් තෝරා ගැනීමට සිදුවන විටෙකදී Z ලකුණු කුසලතාව බලපැවැත්වේ.

3.4.3 තොරතුරු සන්නිවේදන තාක්ෂණය හා බටහිර සංගීතය යන පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වුව ද, සිංහල හා දෙමළ මාධ්‍යය පාසල්වල පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව පදනම් කොටගෙන සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් අ.පො.ස. (උ.පෙළ) හැදෑරූ සිසුන් අතුරින් බඳවා ගනු ලැබේ.

3.5 සියළුම සුදුසුකම් ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතුය.

4.0 *අධ්‍යාපන සුදුසුකම් හා විශේෂ අවශ්‍යතා*.- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල පැවැත්වෙන එක් එක් පාඨමාලාවට අදාළ අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් විශේෂ අවශ්‍යතා පහත දැක්වේ :

4.1 පාඨමාලා අංකය 01 - ප්‍රාථමික අධ්‍යාපනය - (සිංහල)
ප්‍රාථමික අධ්‍යාපනය - (දෙමළ)

4.1.1 2008 වර්ෂයේ පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේදී සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයය තුනකින් (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා සිංහල/දෙමළ භාෂාව ඇතුළු විෂයයන් දෙකකින්) සමත්වීම,

*හා*

4.1.2 සිංහල/දෙමළ භාෂාවට හා තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව ගණිතය ඇතුළුව හර විෂයයන් 06කින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම.

4.2 පාඨමාලා අංකය 02 - විද්‍යාව (සිංහල
විද්‍යාව (දෙමළ)
විද්‍යාව (ඉංග්‍රීසි)

4.2.1 2008 වර්ෂයේ පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේදී භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ ජීව විද්‍යාව යන විෂයයන් තුනෙන් (03) (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා විෂයයන් දෙකකින්) සමත්වීම ;

*හා*

4.2.2 සිංහල/දෙමළ භාෂාවට සාමාර්ථය හා 32 ගණිතය හෝ 42 ගණිතය විෂයට සම්මාන සාමාර්ථයක් ඇතුළුව හර විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම.

*සැලකිය යුතුයි*

* **විද්‍යාව (ඉංග්‍රීසි මාධ්‍යය) පාඨමාලාව සඳහා**

(i) අ. පො. ස. (උ. පෙළ) විභාගයේදී 4.2.1 හා 4.2.2 සුදුසුකම් සපුරා ඉංග්‍රීසි මාධ්‍යයෙන් අ. පො. ස. (උ. පෙළ) පාඨමාලාව හදාරා ඇති අයදුම්කරුවන් අතුරින් 50% ද,

(ii) අ. පො. ස. (උ. පෙළ) විභාගයේදී 4.2.1 හා 4.2.2 සුදුසුකම් සපුරා සිංහල/දෙමළ මාධ්‍යයෙන් අ. පො. ස. (උ. පෙළ) පාඨමාලාව හදාරා ඇති අයදුම්කරුවන් අතුරින් 50% ද තෝරා ගනු ලැබේ.

4.3 පාඨමාලා අංකය 03 - **ගණිතය (සිංහල)**
**ගණිතය (දෙමළ)**
**ගණිතය (ඉංග්‍රීසි)**

4.3.1 2008 වර්ෂයේ පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේදී ගණිතය, සංයුක්ත ගණිතය, උසස් ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන්ගෙන් විෂයයන් තුනකින් (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා ගණිතය විෂයය ධාරාවට අයත් ගණිතය, සංයුක්ත ගණිතය හෝ උසස් ගණිතය යන විෂයයන් එකක් සහිතව ඉහත විෂයයන් දෙකකින්) සමත්වීම ;

*හා*

4.3.2 සිංහල/දෙමළ භාෂාවට සාමාර්ථය හා 34 විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් ඇතුළුව හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම.

*සැලකිය යුතුයි*

* **ගණිතය (ඉංග්‍රීසි මාධ්‍යය) පාඨමාලාව සඳහා**

(i) අ. පො. ස. (උ. පෙළ) විභාගයේදී 4.3.1 හා 4.3.2 සුදුසුකම් සපුරා ඉංග්‍රීසි මාධ්‍යයෙන් අ. පො. ස. (උ. පෙළ) පාඨමාලාව හදාරා ඇති අයදුම්කරුවන් අතුරින් 50% ද,

(ii) අ. පො. ස. (උ. පෙළ) විභාගයේදී 4.3.1 හා 4.3.2 සුදුසුකම් සපුරා සිංහල/දෙමළ මාධ්‍යයෙන් අ. පො. ස. (උ. පෙළ) පාඨමාලාව හදාරා ඇති අයදුම්කරුවන් අතුරින් 50% ද තෝරා ගනු ලැබේ.

4.4 පාඨමාලා අංකය 04 - **ශාරීරික අධ්‍යාපනය (සිංහල)**

- **ශාරීරික අධ්‍යාපනය (දෙමළ)**

4.4.1 2008 වර්ෂයේ පවත්වන ලද අ. පො. ස (උ. පෙළ) විභාගයේදී ඕනෑම විෂයයන් තුනකින් සමත්වීම

*හා*

4.4.2 සිංහල/දෙමළ භාෂාව, සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය හා ගණිතය ඇතුළුව හර විෂයයන් හයකින් අ. පො. ස (සා. පෙළ) විභාගයෙන් සමත්වීම

*හා*

4.4.3 පිළිගත්, ජවන හා පිටිය මළල ක්‍රීඩා සංවිධානාත්මක ක්‍රීඩා පිළිබඳ ප්‍රවීණතාවයක්/දක්ෂතාවයක් ලබා තිබීම, විවිධ ක්‍රීඩා/ඉසව් තුනකට උපරිම වශයෙන් ලකුණු 75ක් ප්‍රදානය කිරීම පහත දැක්වෙන අනුපිළිවෙලට සිදුකරනු ලැබේ.

*ක්‍රීඩා/ඉසව් ප්‍රමුඛතා අනුපිළිවෙල*

| *අනු. අංකය* | *මට්ටම/විෂය* | *කේවල* | *සමූහ* | *ස්ථානය/ ශ්‍රේණිය* | *ලකුණු* |
|---|---|---|---|---|---|
| 1 | අන්තර් ජාතික මට්ටම | කේවල | - | 1 | 25 |
| 2 | අන්තර් ජාතික මට්ටම | කේවල | - | 2 | 24 |
| 3 | අන්තර් ජාතික මට්ටම | කේවල | - | 3 | 23 |
| 4 | අන්තර් ජාතික මට්ටම | - | සමූහ | 1 | 22 |
| 5 | අන්තර් ජාතික මට්ටම | - | සමූහ | 2 | 21 |
| 6 | අන්තර් ජාතික මට්ටම | - | සමූහ | 3 | 20 |
| 7 | අන්තර් ජාතික නියෝජනය | කේවල | සමූහ | - | 19 |
| 8 | ජාතික මට්ටම | කේවල | - | 1 | 18 |
| 9 | ජාතික මට්ටම | කේවල | - | 2 | 17 |
| 10 | ජාතික මට්ටම | කේවල | - | 3 | 16 |
| 11 | ජාතික මට්ටම | - | සමූහ | 1 | 15 |
| 12 | ජාතික මට්ටම | - | සමූහ | 2 | 14 |
| 13 | ජාතික මට්ටම | - | සමූහ | 3 | 13 |
| 14 | පළාත් මට්ටම | කේවල | - | 1 | 12 |
| 15 | පළාත් මට්ටම | කේවල | - | 2 | 11 |
| 16 | පළාත් මට්ටම | කේවල | - | 3 | 10 |
| 17 | පළාත් මට්ටම | - | සමූහ | 1 | 09 |
| 18 | පළාත් මට්ටම | - | සමූහ | 2 | 08 |
| 19 | පළාත් මට්ටම | - | සමූහ | 3 | 07 |
| 20 | රෙජිමේන්තු සැරයන් මේජර්/බළලත් නිලධාරි 1 | - | - | - | 06 |
| 21 | ජනාධිපති බාලදක්ෂ/බාලදක්ෂිකා | - | - | - | 06 |
| 22 | සාජන්ට් මේජර්/බළලත් නිලධාරි 2 | - | - | - | 05 |
| 23 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල | කේවල | - | 1 | 06 |
| 24 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල | කේවල | - | 2 | 05 |
| 25 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල | කේවල | - | 3 | 04 |
| 26 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල | - | සමූහ | 1 | 03 |
| 27 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල | - | සමූහ | 2 | 02 |
| 28 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල | - | සමූහ | 3 | 01 |

4.4.4 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය විෂයයට ඔවුන් ලබා ඇති සාමාර්ථයන් අනුව අතිරේක ලකුණු හිමිවේ.

A සාමාර්ථය - 05
B සාමාර්ථය - 03
C සාමාර්ථය - 02

*සැලකිය යුතුයි.-*

(i) *පිළිගත් ක්‍රීඩා තරග (අන්තර් ජාතික).-* අධ්‍යාපන අමාත්‍යාංශය/ක්‍රීඩා අමාත්‍යාංශය සහ ඒවායේ ලියාපදිංචි ජාතික ක්‍රීඩා සංගම් මගින් (වෙස්, කැරම්,දාම් හැර) ශ්‍රී ලංකාවේ ජාතික කණ්ඩායම් හෝ පාසල් ජාතික ක්‍රීඩා කණ්ඩායම් නියෝජනය කරමින් සහභාගි වන අන්තර් ජාතික තරග (පාසල් ක්‍රීඩා කණ්ඩායම් පෞද්ගලිකව සහභාගි වන අන්තර් ජාතික තරග සලකා නොබැලේ.)

(ii) *පිළිගත් ක්‍රීඩා තරග.-* අධ්‍යාපන අමාත්‍යාංශය/ක්‍රීඩා අමාත්‍යාංශය/ජාතික තරුණ සේවා සභාව මගින් සංවිධානය කරනු ලබන ජාතික මට්ටමේ ක්‍රීඩා තරග.

පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය/පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය/ජාතික තරුණ සේවා සභාව මගින් සංවිධානය කරනු ලබන පළාත් මට්ටමේ ක්‍රීඩා තරග.

පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය/ජාතික තරුණ සේවා සභාව මගින් සංවිධානය කරනු ලබන දිස්ත්‍රික් මට්ටමේ ක්‍රීඩා තරග/පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සංවිධානය කරනු ලබන අධ්‍යාපන කලාප මට්ටමේ ක්‍රීඩා තරග.

(iii) ක්‍රීඩා අමාත්‍යාංශය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි හා පිළිගත් ක්‍රීඩා සංගම් මගින් සංවිධානය කරන ලද ඒ ශ්‍රේණියේ තරගවල 1,2 හා 3 වන ස්ථානවලට පමණක් අනුපිළිවෙලින් ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

(iv) ඉල්ලුම්පත්‍ර කැඳවීමේ අවසාන දිනයට පූර්වයෙන් වූ වර්ෂ 05 තුළ ලබාගත් ක්‍රීඩා ප්‍රවීණතාවයක්/දක්ෂතාවයක් මේ සඳහා වලංගු වේ.

(v) ක්‍රීඩා සහතික තුනකට ලකුණු දීමේ දී ලකුණු හිමි වන්නේ එකම ඉසව්වකට එකම වසරක දී ලබාගත් සහතිකවලින් එක් ඉහළම සහතිකයකට පමණි.

**4.5 පාඨමාලා අංක 05 - ගෘහ ආර්ථික විද්‍යාව හා ආහාර තාක්‍ෂණය (සිංහල)**
**ගෘහ ආර්ථික විද්‍යාව හා ආහාර තාක්‍ෂණය (දෙමළ)**

4.5.1 2008 වර්ෂයේ අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ගෘහ ආර්ථික විද්‍යාව ඇතුළුව විෂයය තුනකින් සමත්වීම ;

*හා*

4.5.2 විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව සිංහල/දෙමළ භාෂාව, ගණිතයද ඇතුළුව හර විෂයය හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම.

**4.6 පාඨමාලා අංක 06 - ඉංග්‍රීසි**

4.6.1 2008 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව (සාමාන්‍ය ඉංග්‍රීසි නොවේ) ඇතුළුව විෂයය තුනකින් සමත්වීම හා අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ද, සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ද ඇතුළුව හර විෂයය හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන්/ලන්ඩන් අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම ;

*හෝ*

4.6.2 2008 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂයය තුනකින් සමත්වීම හා 2008 වර්ෂයේ දී පවත්වන ලද ලන්ඩන් අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි ඇතුළුව විෂයයන් තුනකින් එකවර සමත්වීම සහ අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන්/ලන්ඩන් අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් හා සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ද ඇතුළුව හර විෂයයන් හයකින් සමත්වීම ;

*හෝ*

4.6.3 2008 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් සමත්වීම හා අ. පො. ස (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට අධි සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සම්මාන සාමාර්ථයක් හා සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ද ඇතුළුව හර විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම.

*සැළකිය යුතුයි* :

(i) ඉංග්‍රීසි පාඨමාලාවට තෝරා ගැනීමේ දී 4.6.1 හා 4. 6. 2 යටතේ සුදුසුකම් සපුරන අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව හිමිවේ. ඔවුන් ප්‍රවීණතා පරීක්‍ෂණයට පෙනී සිටිය යුතු නැත. සම්මුඛ පරීක්‍ෂණයේ දී සුදුසුකම් තහවුරු කළ යුතුය.

(ii) 4.6.3 යටතේ සුදුසුකම් සපුරන අයදුම්කරුවන් තෝරා ගැනීමේ පරීක්‍ෂණයෙහි ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

4.7 *පාඨමාලා අංකය 07 - බුද්ධ ධර්මය*

බුද්ධ ධර්මය පාඨමාලාවට බෞද්ධ භික්ෂූන් වහන්සේලාට ද, මෙහෙණින් වහන්සේලාට ද, ගිහි අයදුම්කරුවන්ට ද ඉල්ලුම් කළ හැකිය. සියළුම අවශ්‍යතා 2008 වසරේ හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතුය. (ගිහි අයදුම්කරුවන්ගේ සියළුම අධ්‍යාපන සුදුසුකම් 2008 වසරේ හෝ ඊට පෙර ගිහි නමින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.)

4.7.1 2008 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී බුද්ධ ධර්මය, බෞද්ධ ශිෂ්ඨාචාරය, පාලි හා සිංහල යන විෂයයන්ගෙන් දෙකක් ඇතුළුව විෂයයන් තුනකින් සමත්වීම.

4.7.2 ප්‍රාචීන, ප්‍රාරම්භ විභාගයෙන් සමත්වීම (බෞද්ධ භික්ෂූන් වහන්සේලාට/මෙහෙණින් වහන්සේලාට පමණි.)

4.7.3 බෞද්ධ ධර්මාචාර්ය විභාගයෙන් සමත්වීම.

4.7.4 දහම් පාසල් අවසාන විභාගය සමත්වීම

4.7.5 සිංහල භාෂාව, බුද්ධ ධර්මය හා ගණිතය ඇතුළු හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ)/සිංහල භාෂාව, ගණිතය, ත්‍රිපිටක ධර්මය ඇතුළු හර විෂයයන් හයකින් (06) මූලික පිරිවෙන් අවසාන විභාගයෙන් සමත්වීම

සැලකිය යුතුයි :

(i) තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල -

(අ) 4.7.1, 4.7.2, 4.7.3, 4.7.4, 4.7.5 යන සියළුම සහතික ඇති අයදුම්කරුවන්
(ආ) 4.7.1, 4.7.2 සහ 4.7.5 සහතික ඇති අයදුම්කරුවන්
(ඉ) 4.7.1, 4.7.3, 4.7.5 සහතික ඇති අයදුම්කරුවන්
(ඊ) 4.7.1, 4.7.4, 4.7.5 සහතික ඇති අයදුම්කරුවන්
(උ) 4.7.1, 4.7.5 සහතික ඇති අයදුම්කරුවන්

**4.8 පාඨමාලා අංකය 08 - හින්දු ධර්මය**

4.8.1 2008 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී හින්දු ධර්මය, හින්දු ශිෂ්ටාචාරය හා සංස්කෘත යන විෂයයන්ගෙන් විෂයය එකක් ඇතුළුව විෂයයන් තුනකින් සමත්වීම
4.8.2 ශෛව සිද්ධාන්ත පණ්ඩිතර් සහතිකය ලබා තිබීම
4.8.3 ශෛව පුලවර් සහතිකය ලබා තිබීම
4.8.4 ඉලං ශෛව පුලවර් සහතිකය ලබා තිබීම.
4.8.5 දෙමළ භාෂාව, ගණිතය සහ හින්දු ධර්මය ඇතුළු හර විෂයයන් 06කින් අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම.

**සැලකිය යුතුයි :**

***තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල***

(අ) 4.8.1, 4.8.5. සහ අනිකුත් සියළුම සහතික හිමි අයදුම්කරුවන්
(ආ) 4.8.1, 4.8.4, 4.8.5 සහ අනිකුත් සහතික දෙකෙන් එකක් ලැබූ අයදුම්කරුවන්
(ඉ) 4.8.1, 4.8.5 සහ අනිකුත් සහතික තුනෙන් එකක් ලැබූ අයදුම්කරුවන්
(ඊ) 4.8.1, 4.8.5. සහතික ලැබූ අයදුම්කරුවන්

ඉහත සඳහන් සියළුම අවශ්‍යතා 2008 වර්ෂයේ දී හෝ ඊට පෙර ලබා තිබිය යුතුයි.

***4.9 පාඨමාලා අංකය 09 - ඉස්ලාම් ධර්මය***

4.9.1 2008 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඉස්ලාම් ධර්මය, ඉස්ලාම් ශිෂ්ටාචාරය හා අරාබි යන විෂයයන්ගෙන් විෂයය එකක් ඇතුළුව විෂයයන් තුනකින් සමත්වීම
4.9.2 අල්-ආලිම් විභාගය (1 වන කොටස හා 2 වන කොටස යන දෙකෙන්ම) සමත් වීම,
4.9.3 මෞලවි සහතිකය ලබා තිබීම හා අල් - ආලිම් විභාගය 1 කොටස සමත්වීම,
4.9.4 මෞලවි සහතිකය ලබා තිබීම
4.9.5 දෙමළ භාෂාව, ගණිතය සහ ඉස්ලාම් ධර්මය ඇතුළු හර විෂයයන් 06 කින් අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම

සැලකිය යුතුයි - **තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල** -

(අ) 4.9.1, 4.9.5. සහ ඉහත සියළුම සහතික හිමි අයදුම්කරුවන්
(ආ) 4.9.1, 4.9.3, 4.9.4 සහ 4.9.5 සහතික හිමි අයදුම්කරුවන්
(ඉ) 4.9.1, 4.9.4 සහ 4.9.5 සහතික හිමි අයදුම්කරුවන්
(ඊ) 4.9.1 සහ 4.9.5 සහතික හිමි අයදුම්කරුවන්

ඉහත සඳහන් සියළුම අවශ්‍යතා 2008 වර්ෂයේ දී හෝ ඊට පෙර ලබා තිබිය යුතුයි.

**4.10 පාඨමාලා අංකය 10 - කතෝලික ධර්මය/ක්‍රිස්තියානි ධර්මය (සිංහල)**
**කතෝලික ධර්මය/ක්‍රිස්තියානි ධර්මය (දෙමළ)**

4.10.1 2008 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් සමත්වීම ;

*හා*

සිංහල/දෙමළ භාෂාව, ගණිතය සාමාර්ථයද ඇතුළුව හර විෂයයන් 6කින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම ;

*හා*

අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් ක්‍රිස්තු ධර්මය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් හෝ අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් කතෝලික ධර්මය/ක්‍රිස්තියානි ධර්මය විෂයයට සම්මාන සාමාර්ථයක් ;

*හා*

අයදුම්කරු කතෝලික ධර්මය/ක්‍රිස්තියානි ධර්මය ගුරුවරයෙකු වීමට සුදුසු බවට කතෝලිකයන් සඳහා කතෝලික රදගුරු පදවි සහතිකය ද ක්‍රිස්තියානියන් සඳහා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ සහතිකය ද ලබා තිබීම.

4.10.2 කතෝලික ධර්මය අයදුම්කරුවන් තෝරා ගැනීම පහත දැක්වෙන සුදුසුකම්වලට අනුපිළිවෙලින් ප්‍රමුඛත්වය දී සිදුකරනු ලැබේ.

4.10.2.1 ජාතික දෙවි සත්හලේ දේව ධර්මය පිළිබඳ සිව් අවුරුදු පාඨමාලා සහතිකය ;

*හෝ*

4.10.2.2 ජාතික දෙවි සත්හලේ කිතුනු දර්ශනය පිළිබඳ පාඨමාලා සහතිකය ;

*හෝ*

4.10.2.3 දේව ධර්ම නිකේතනයේ තුන් අවුරුදු ආගමික අධ්‍යයන පාඨමාලා සහතිකය ;

*හෝ*

4.10.2.4 පැවිදිවරයෙකු/පැවිදිවරියක වීම සඳහා ආගමික අධ්‍යයන සහ පුහුණු පාඨමාලාව (නොවිෂියේට්) පාඨමාලාව සාර්ථකව හදාරා අවසන් කළ බවට පැවිදි නිකායන්ගේ ශ්‍රේෂ්ඨාධිපති/ශ්‍රේෂ්ඨාධිපතිනිය හෝ අදාළ රදගුරුතුමන් විසින් නිකුත් කරන ලද සහතිකය ;

*හෝ*

4.10.2.5 ජාතික ධර්මෝපදේශක මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන කතෝලික ධර්මාචාර්ය (දහම් ගුරු) විභාගයක් සමත්වීම

එනම් ;
ධර්මාචාර්ය ගෞරව (දහම් ගුරු 3) ;
*හෝ*
ධර්මාචාර්ය විශේෂ (දහම් ගුරු 2) ;
*හෝ*
ධර්මාචාර්ය සාමාන්‍යය (දහම් ගුරු 1) ;
*හෝ*

4.10.2.6 අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ක්‍රිස්තියානි ධර්මය විෂයය සමත්වීම.

4.10.3 ක්‍රිස්තු ධර්මය අයදුම්කරුවන් තෝරාගැනීම අනුපිළිවෙලින් පහත දැක්වෙන සුදුසුකම් අනුව කරනු ලැබේ.

4.10.3.1 පිළිමතලාව ලංකා දේව ධර්ම ශාස්ත්‍රාලය මගින් පවත්වනු ලබන ධර්මවේදී ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

4.10.3.2 ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය මගින් පවත්වනු ලබන ආගමික දැනුම පිළිබඳ ජාතික සහතිකය (ධර්මාචාර්ය) ලබා තිබීම.

සැලකිය යුතුයි - (i) බඳවා ගන්නා මුළු සංඛ්‍යාවෙන් 90% ක් තෝරා ගැනීම සඳහා 4.10.1 යටතේ සුදුසුකම් ලබන කතෝලික අයදුම්කරුවන් අතරින් 4.10.2 යටතේ දැක්වෙන අනුපිළිවෙල අනුව තෝරා ගනු ලැබේ. 90% කතෝලික අයදුම්කරුවන් ඉදිරිපත්වී නොමැති නම් එම පුරප්පාඩු සඳහා ක්‍රිස්තියානි අයදුම්කරුවන් තෝරාගනු ලැබේ.

(ii) බඳවා ගන්නා මුළු සංඛ්‍යාවෙන් 10% ක් 4.10.1 යටතේ සුදුසුකම් ලබන ක්‍රිස්තු ධර්මය අයදුම්කරුවන් අතරින් 4.10.3 යටතේ දැක්වෙන අනුපිළිවෙල අනුව තෝරා ගනු ලැබේ. 10% ක් ක්‍රිස්තියානි අයදුම්කරුවන් ඉදිරිපත්වී නොමැති නම් එම පුරප්පාඩු සඳහා කතෝලික අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

(iii) බඳවා ගන්නා මුළු අයදුම්කරුවන් සංඛ්‍යාවෙන් 40%ක් කතෝලික හා ක්‍රිස්තියානි පූජක පක්ෂයෙන් තෝරා ගනු ලැබේ. 40% ක පූජක පක්ෂයේ අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් වී නොමැති නම් එම පුරප්පාඩු සඳහා ගිහි අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

(iv) පූජක පක්ෂයේ අයදුම්කරුවන් අතර 2008 වර්ෂයේ අ. පො. ස. (උසස් පෙළ) සමත් වූ අයදුම්කරුවන් අවශ්‍ය සංඛ්‍යාව නොමැති නම් 2007, 2006, 2005, 2004 සහ 2003 යන වර්ෂයට අනුපිළිවෙලින් ආසන්නතම වර්ෂ සලකා අ. පො. ස. (උසස් පෙළ) සමත්වූ පූජක/පැවිදි පක්ෂයේ අයදුම්කරුවන්ගෙන් තෝරා ගනු ලැබේ.

4.11 **පාඨමාලා අංකය ii - විශේෂ අධ්‍යාපනය (සිංහල)**
**විශේෂ අධ්‍යාපනය (දෙමළ)**

4.11.1 2008 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් (03) සමත්වීම ;

*හා*

4.11.2 සිංහල/දෙමළ භාෂාව, ගණිතය ඇතුළුව හර විෂයයන් 06කින් අ. පො. ස. (සා. පෙළ) සමත් වීම.

*සැළකිය යුතුයි* - මෙම පාඨමාලාවට තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට පුහුණුවෙන් පසුව විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ශ්‍රවන, දෘෂ්ටි බුද්ධිමය ඌනතා, ඕටිසම්, ඉගෙනුම් දුෂ්කරතා, බහුවිධ දුබලතා ආදී ක්ෂෙත්‍ර සඳහා ගුරුවරුන් ලෙස පත්වීම් ලබා දීම සඳහා සලකා බලනු ඇත. එබැවින් ඉහත විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් සිටින පංතිවල සේවය කිරීමට එකග වන අයදුම්කරුවන් පමණක් මෙම පාඨමාලාවට අයදුම් කළ යුතු වේ.

4.12 **පාඨමාලා අංකය 12 - කෘෂිකර්මය (සිංහල)**
**කෘෂිකර්මය (දෙමළ)**

4.12.1 2008 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී කෘෂිවිද්‍යාව, ජීව විද්‍යාව, රසායන විද්‍යාව, යන විෂයයන් 03න් සමත්වීම ;

*හෝ*

4.12.2 2008 වර්ෂයේදී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේදී කෘෂිකර්මය/කෘෂි තාක්‍ෂණවේදය/ජෛව සම්පත් තාක්‍ෂණවේදය/ආහාර තාක්‍ෂණවේදය විෂයය ඇතුළුව විෂයයන් තුනකින් සමත්වීම.

*හා*

4.12.3 ගණිතය සහ විද්‍යාව යන විෂයයන්ට සම්මාන සාමාර්ථයන් සහිතව සිංහල/දෙමළ භාෂාව ඇතුළු හර විෂයන් 06කින් අ. පො. ස. (සා. පෙළ.) සමත්වීම.

*සැළකිය යුතුයි* - සිසුන් බඳවා ගැනීමේදී 4.12.1 සුදුසුකම් ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය හිමි වේ.

4.13 **පාඨමාලා අංක 13 - තාක්‍ෂණ අධ්‍යයනය (සිංහල)**
**තාක්‍ෂණ අධ්‍යයනය (දෙමළ)**

4.13.1 නිර්මාණකරණය හා තාක්ෂණවේදය

4.13.1.1 2008 වර්ෂයේදී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී තාක්‍ෂණවේදය විෂය මාලාවට අයත් දෘඪ තාක්‍ෂණවේදය සංරචකයට අයත් සිවිල් තාක්‍ෂණවේදය, යාන්ත්‍රික තාක්‍ෂණවේදය, විදුලිය හා ඉලෙක්ට්‍රොනික හා තොරතුරු තාක්‍ෂණ වේදය යන විෂයයන්ගෙන් එකක් ඇතුළුව විෂයන් 03කින් සමත්වීම ;

*හෝ*

4.13.1.2 2008 වර්ෂයේදී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් 3 කින් සමත්වීම ;

*හා*

4.13.1.3 ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ද, ලී වැඩ/මේසන් වැඩ/ඉදිකිරීම් තාක්‍ෂණය, ලෝහ වැඩ/මෝටර් කාර්මික ශිල්පය/යාන්ත්‍රික තාක්‍ෂණය/ගුවන්විදුලි කාර්මික ශිල්පය/විදුලි හා ඉලෙක්ට්‍රොනික තාක්‍ෂණය යන විෂයයන්ගෙන් එකක් ද ඇතුළුව හර විෂයයන් 6කින් අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම.

4.13.2 ශිල්ප කලා :

4.13.2.1 2008 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂයන් 3 කින් සමත් වීම ;

*හා*

4.13.2.2 ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ද, විවීම/මැටි ශිල්පය/කලා ශිල්ප යන විෂයන්ගෙන් එකක් ද ඇතුළුව හර විෂයයන් හයකින් (06) කින් අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම.

*හා*

4.13.3 රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක/ජාතික ආධුනිකත්ව මණ්ඩලය/වෘත්තිය පුහුණු අධිකාරිය/පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව/කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව සහ වෙනත් මධ්‍යම රජයේ හෝ පළාත් සභාවක අමාත්‍යාංශයක් යටතේ පාලනය වන ආයතනයක් මඟින් පවත්වන, විෂය සාධන මට්ටම දැක්වෙන විධිමත් සහතික නිකුත් කරනු ලබන මාස 10කට නොඅඩු විෂයය ක්ෂත්‍රයට අදාළ ශිල්පීය පාඨමාලාවක් හදාරා සාර්ථකව නිමකර තිබීම.

*සැලකිය යුතුයි* :

(i) තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල ‍:

* **නිර්මාණකරණය හා තාක්‍ෂණවේදය**

(අ) 4.13.1.1 හා 4.13.1.3 සහතික ඇති අයදුම්කරුවන්

(ආ) 4.13.1.2, 4.13.1.3 හා 4.13.3 සහතික ඇති අයදුම්කරුවන් එසේ වුවද ඉහත (අ), (ආ) හි සඳහන් සුදුසුකම් සපුරාලූ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ඉදිරිපත් වී නොමැති නම් 2007 සහ 2006 වසර වලදී (අ) හෝ (ආ) සුදුසුකම් ලද අයදුම්කරුවන් පිළිවෙලින් සලකා බැලේ.

* **ශිල්ප කලා**

(අ) 4.13.2.1, 4.13.2.2 හා 4.13.3 සහතික ඇති අයදුම්කරුවන්

(ආ) 4.13.2.1 හා 4.13.2.2 සහතික ඇති අයදුම්කරුවන්

ඉහත (අ) හි සඳහන් සුදුසුකම් සපුරාලූ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ඉදිරිපත් වී නොමැති නම් 2007 සහ 2006 වසර වලදී (අ) සුදුසුකම් ලද අයදුම්කරුවන් පිළිවෙලින් සලකා බැලේ. තවදුරටත් පුරප්පාඩු පැවතිය හොත් පමණක් ඉහත (ආ) හි සුදුසුකම් සපුරාලූ අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සලකා බැලේ.

(ii) ඉල්ලුම් පත්‍රයේ අංක 16.1 යටතේ ඉල්ලුම් කරන විෂය ක්ෂත්‍රය (නිර්මාණකරණය හා තාක්‍ෂණය වේදය/ශිල්ප කලා යන්න) පැහැදිලිව සටහන් කළ යුතුය.

(iii) ඉල්ලුම් පත්‍ර කැඳවීමේ අවසාන දිනට හෝ ඊට පෙර ඉහත දැක්වෙන සියලු අවශ්‍යතා සම්පූර්ණ කර තිබිය යුතුය.

4.14 පාඨමාලා අංක 14 - **චිත්‍ර (සිංහල)**
**චිත්‍ර (දෙමළ)**

4.14.1 2008 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී චිත්‍රකලා විෂය ඇතුළු විෂයයන් තුනකින් සමත් වීම ;

*හා*

4.14.2 සිංහල/දෙමළ භාෂාව, ගණිතය හා චිත්‍ර ඇතුළු හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

4.14.3 2008 වසරේ අ. පො. ස. (උ. පෙළ.) විභාගයේ දී චිත්‍ර/චිත්‍ර හා මූර්ති විෂය සඳහා ලබා ඇති ශ්‍රේණිය මත අතිරේක ලකුණක් ප්‍රදානය කරනු ලැබේ.

4.15 *පාඨමාලා අංක 15* - *නැටුම් (පෙරදිග)*

4.15.1 2008 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී නැටුම් විෂය ඇතුළු විෂයයන් තුනකින් සමත්වීම ;

*හා*

4.15.2 සිංහල භාෂාව, ගණිතය හා නැටුම් ඇතුළු හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම.

4.15.3 2008 වසරේ අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී නැටුම් විෂය සඳහා ලබා ඇති ශ්‍රේණිය මත අතිරේක ලකුණක් ප්‍රදානය කරනු ලැබේ.

4.16 *පාඨමාලා අංකය 16* - *නැටුම් (භරත)*

4.16.1 2008 වර්ෂයේදී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී භරත නැටුම් ඇතුළුව විෂයයන් තුනකින් (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට භරත නැටුම් ඇතුළු විෂයය දෙකකින්) සමත්වීම ;

හා

4.16.2 දෙමළ භාෂාව, ගණිතය හා භරත නැටුම් ඇතුළු හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

4.16.3 2008 වසරේ අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී නැටුම් (භරත) විෂය සඳහා ලබා ඇති ශ්‍රේණිය අනුව අතිරේක ලකුණක් ප්‍රදානය කරනු ලැබේ.

*සැළකිය යුතුයි* - (ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා අදාළ සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් 2008 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී එකවර විෂයයන් දෙකකින් සමත්ව අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී භරත නැටුම් විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා ඇති ඉල්ලුම්පත්‍ර සළකා බලනු ලැබේ.)

**4.17 පාඨමාලා අංකය 17 - සංගීතය (පෙරදිග)**

4.17.1 2007 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී සංගීත විෂය ඇතුළු විෂයයන් තුනකින් සමත් වීම ;

හා

4.17.2 සිංහල භාෂාව, ගණිතය හා සංගීතය ඇතුළු හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම.

4.17.3 2008 වසරේ අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී සංගීතය විෂය සඳහා ලබා ඇති ශ්‍රේණිය මත අතිරේක ලකුණක් ප්‍රදානය කරනු ලැබේ.

**4.18 පාඨමාලා අංකය 18 - සංගීතය (කර්ණාට)**

4.18.1 2008 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී කර්ණාට සංගීතය ඇතුළු විෂයයන් තුනකින් (ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා කර්ණාට සංගීතය ඇතුළු විෂයයන් දෙකකින්) සමත්වීම ;

හා

4.18.2 දෙමළ භාෂාව, ගණිතය හා කර්ණාට සංගීතය ඇතුළු හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම.

4.18.3 2008 වසරේ අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී සංගීතය (කර්ණාට) විෂය සඳහා ලබා ඇති ශ්‍රේණිය මත අතිරේක ලකුණක් ප්‍රදානය කරනු ලැබේ.

*සැළකිය යුතුයි* -

(i) (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා අදාළ සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් 2008 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී එකවර විෂයයන් දෙකකින් සමත්ව අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී කර්ණාට සංගීතය විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා ඇති ඉල්ලුම්පත්‍ර සළකා බලනු ලැබේ.)

**4.19 පාඨමාලා අංකය 19 - බටහිර සංගීතය (ඉංග්‍රීසි)**

4.19.1 2008 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී බටහිර සංගීතය ඇතුළු විෂයයන් තුනකින් සමත්වීම ;

හා

ඉංග්‍රීසි භාෂාව සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයය සාමාන්‍ය සාමාර්ථයක් ද සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ බටහිර සංගීතය ඇතුළු හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම ;

හෝ

4.19.2 2008 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් සමත් වීම ;

හා

ඉංග්‍රීසි භාෂාව සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය සාමාන්‍ය සාමාර්ථයක් ද සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ බටහිර සංගීතය ඇතුළු හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම

හා

අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයතනයක බටහිර සංගීතය පිළිබඳව පස්වැනි පන්තිය සමත්වීම (න්‍යායික හා ප්‍රායෝගික)

හෝ

අ. පො. ස. (උ. පෙළ) බටහිර සංගීතය විෂය අමතර විෂයයක් ලෙස සමත්ව තිබීම.

*සැලකිය යුතුයි :*

(i) බටහිර සංගීත පාඨමාලාව සඳහා පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයේ දී සතුටුදායක කුසලතා මට්ටමකට ළඟා වීම.

(ii) එම පාඨමාලාවට තෝරා ගැනීමේ දී ඉහත 4.19.1 යටතේ සුදුසුකම් සපුරාලූ අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

**4.20. පාඨමාලා අංක 20 - නාට්‍ය හා රංග කලාව (සිංහල)**
**නාට්‍ය හා රංග කලාව (දෙමළ)**

4.20.1 2008 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී නාට්‍ය හා රංග කලාව විෂය ඇතුළු විෂයයන් තුනකින් සමත්වීම.

හා

4.20.2 සිංහල/දෙමළ භාෂාව ද ගණිතය සහ නාට්‍ය හා රංග කලාව/සංගීතය/නැටුම් ඇතුළු හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

4.20.3 2008 වසරේ අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී නාට්‍ය හා රංග කලාව විෂය සඳහා ලබා ඇති ශ්‍රේණිය මත අතිරේක ලකුණක් ප්‍රදානය කරනු ලැබේ.

***සැලකිය යුතුයි*** - බඳවා ගැනීමේදී අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී නාට්‍ය හා රංග කලාව විෂය සමත් අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව හිමිවේ. යම් දිස්ත්‍රික්කයක අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී නාට්‍ය හා රංග කලාව විෂය සමත් අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති වුවහොත් පමණක් අ.පො.ස. (සා. පෙළ) විභ්‍යාගයේ දී නැටුම්/සංගීතය විෂය සමත් අයදුම්කරුවන් තෝරා ගැනීම සඳහා සලකා බැලේ.

**4.21 පාඨමාලා අංකය 21 - තොරතුරු සන්නිවේදන තාක්ෂණය (ඉංග්‍රීසි)**

4.21.1 2008 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් (ශ්‍රීපාද අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා විෂයයන් දෙකකින්) සමත් වීම

හා

4.21.2 ඉංග්‍රීසි භාෂාව සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයය සාමාන්‍ය සාමාර්ථයක් සහ ගණිතයට සම්මාන සාමාර්ථයක් සහිතව සිංහල/දෙමළ භාෂාව ඇතුළුව හර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්වීම

*සැලකිය යුතුයි -*

(i) මෙම පාඨමාලාවට අයදුම්කරන අයදුම්කරුවන් තෝරාගැනීමේ පරීක්ෂණයට පෙනී සිටිය යුතුවේ. (කරුණාකර 6.1.2 ඡේදය බලන්න).
(ii) මෙම ප්‍රශ්න පත්‍රය වාස්තවික වර්ගයේ ප්‍රශ්නවලින් යුක්ත පැය 1 1/2 ක ප්‍රශ්න පත්‍රයකි. මෙමගින්, තොරතුරු සන්නිවේදන තාක්ෂණය පාඨමාලාව හැදෑරීම සඳහා අවශ්‍යවන මූලික ගණිත සංකල්ප සම්බන්ධයෙන් අපේක්ෂකයන්ගේ නිපුණතාව මැන බැලීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයකි.
(iii) තෝරාගැනීමේ පරීක්ෂණයට සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන ඕනෑම මාධ්‍යයකින් පෙනීසිටිය හැකිය.
(iv) තෝරාගැනීමේ පරීක්ෂණයට පෙනීසිටින භාෂා මාධ්‍යය අයදුම්පත්‍රයේ 1.0 ඡේදයේ (මාධ්‍යය S/T/E තීරුවේ) සටහන් කළ යුතුය.

**4.22 පාඨමාලා අංකය 22 - සමාජීය විද්‍යාව (සිංහල)**
**සමාජීය විද්‍යාව (දෙමළ)**

4.22.1 2008 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ඉතිහාසය, දේශපාලන විද්‍යාව, භූගෝල විද්‍යාව යන විෂයයන්ගෙන් එකක් ඇතුළුව විෂයයන් තුනකින් (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා විෂයයන් දෙකකින්) සමත් වීම ;

හා

4.22.2 සමාජ අධ්‍යයනය හා ඉතිහාසය විෂයයට සම්මාන සාමාර්ථයන් සහිතව සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ඇතුළුව හර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ සමාජීය විද්‍යාව පාඨමාලාව පැවැත්වෙන්නේ දෙමළ මාධ්‍ය සිසුන් සඳහා පමණි.).

**4.23 පාඨමාලා අංක 23 - පළමු බස (දෙමළ)**

4.23.1 2008 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස. (උ. පෙළ) විභාගයේ දී දෙමළ විෂයයට සම්මාන සාමාර්ථයක් ඇතුළුව විෂයයන් තුනකින් (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා දෙමළ විෂය ඇතුළු විෂයයන් දෙකකින්) සමත්වීම

හා

4.23.2 දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථය හා ගණිතය ඇතුළු හර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

**4.24 පාඨමාලා අංකය 24 - දෙවන බස (සිංහල)**

4.24.1 දෙවන බස සිංහල පාඨමාලාවේ අයදුම්කරුවන් 2008 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී සිංහල භාෂාවට සම්මාන සාමාර්ථයක් ඇතුළුව විෂයයන් තුනකින් සමත් වීම

හා

4.24.2 අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී සිංහල භාෂාව, ගණිතය ඇතුළු විෂයයන් 06 කින් සමත් වීම.

(***සැලකිය යුතුයි*** - මෙම පාඨමාලාවට බඳවා ගැනීමේ දී අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී දෙවන භාෂාව දෙමළ විෂයය හෝ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දෙවන භාෂාව උසස් පාඨමාලාව හෝ වෛකල්පිත දෙමළ භාෂාව සමත් සිසුන්ට අනුපිළිවෙලින් ප්‍රමුඛතාවය හිමිවේ.).

**4.25 පාඨමාලා අංකය 25- දෙවන බස (දෙමළ)**

4.25.1 දෙවන බස (දෙමළ) පාඨමාලාව අයදුම්කරුවන් 2008 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථයක් සහිතව විෂයයන් තුනකින් සමත් වීම ;

හා

4.25.2 අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී ගණිතය, දෙමළ භාෂාව ඇතුළු විෂයයන් 06 කින් සමත් වීම.

(**සැලකිය යුතුයි.**- මෙම පාඨමාලාවට බඳවා ගැනීමේ දී අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී දෙවන බස සිංහල විෂයය හෝ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දෙවන භාෂාව (සිංහල) උසස් පාඨමාලාව හෝ වෛකල්පිත සිංහල විෂයය සමත් සිසුන්ට අනුපිළිවෙලින් ප්‍රමුඛතාවය හිමිවේ.).

**5.0 පාඨමාලා අංකය, පාඨමාලාවේ නම, මාධ්‍යය අනුව එක් එක් පාඨමාලාව පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය එහි අංකය සහිතව පහතින් දැක්වේ. :-**

(කරුණාකර මේ වගුව හොඳින් පරීක්ෂා කරන්න. සම්මුඛ පරීක්ෂණ සඳහා එක් එක් පාඨමාලාවට අදාළ පරිගණක ලේඛන සකස් කිරීමේ දී ඔබේ ඉල්ලුම් පත්‍රය පරිගණකගත කරන්නේ පාඨමාලා අංකය අනුවය. නිවැරදි තොරතුරු සටහන් නොකළ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රය අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන විද්‍යාපීඨ ශාඛාවට ඉදිරිපත් කළ පසු කිසිදු සංශෝධනයක් කිරීමට ඉඩ දෙනු නොලැබේ.) ඃ

(i) තීරුව - පාඨමාලා අංකය ;
(ii) තීරුව - පාඨමාලාවේ නම ;
(iii) තීරුව - සිංහල මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ;
(iv) තීරුව - දෙමළ මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ;
(v) තීරුව - ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ;
(ඒ ඒ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ අංකය පීඨයේ නම ඉදිරියෙන් වරහන් තුළ දැක්වේ.)

| පාඨමාලා අංකය | පාඨමාලාවේ නම | මාධ්‍යය අනුව එක් එක් පාඨමාලාව පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සහ ඒවායේ අංකය | | |
|---|---|---|---|---|
| | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| *i* | *ii* | *iii* | *iv* | *v* |
| 01 | ප්‍රාථමික අධ්‍යාපනය | (1) ඌව<br>(7) ශ්‍රීපාද<br>(11) පුලතිසිපුර<br>(14) රුහුණ<br>(17) හාපිටිගම | (6) වවුනියා<br>(7) ශ්‍රීපාද<br>(8) අඩ්ඩාලච්චේන<br>(15) යාපනය<br>(16) දර්ගා නගර | |
| 02 | විද්‍යාව | (2) නිල්වලා<br>(5) සියනෑ<br>(7) ශ්‍රීපාද | (6) වවුනියා<br>(7) ශ්‍රීපාද<br>(8) අඩ්ඩාලච්චේන<br>(9) මඩකලපුව<br>(15) යාපනය | (2) නිල්වලා<br>(5) සියනෑ<br>(15) යාපනය |
| 03 | ගණිතය | (2) නිල්වලා<br>(5) සියනෑ<br>(7) ශ්‍රීපාද | (6) වවුනියා<br>(7) ශ්‍රී පාද<br>(8) අඩ්ඩාලච්චේන<br>(9) මඩකලපුව<br>(15) යාපනය | (2) නිල්වලා<br>(5) සියනෑ<br>(15) යාපනය |
| 04 | ශාරීරික අධ්‍යාපනය | (1) ඌව | (6) වවුනියා<br>(8) අඩ්ඩාලච්චේන | |
| 05 | ගෘහ ආර්ථික විද්‍යාව හා ආහාර තාක්ෂණය | (14) රුහුණ | (6) වවුනියා<br>(16) දර්ගා නගර | |
| 06 | ඉංග්‍රීසි | | | (3) මහවැලි<br>(10) පස්දුන්රට<br>(15) යාපනය |
| 07 | බුද්ධ ධර්මය | (4) සාරිපුත්ත | | |
| 08 | හින්දු ධර්මය | | (6) වවුනියා<br>(15) යාපනය | |
| 09 | ඉස්ලාම් | | (8) අඩ්ඩාලච්චේන | |
| 10 | කතෝලික ධර්මය/ක්‍රිස්තියානි ධර්මය | (12) වයඹ | (6) වවුනියා<br>(15) යාපනය | |
| 11 | විශේෂ අධ්‍යාපනය | (17) හාපිටිගම් | (8) අඩ්ඩාලච්චේන<br>(15) යාපනය | |
| 12 | කෘෂිකර්මය | (11) පුලතිසිපුර | (6) වවුනියා<br>(9) මඩකලපුව | |
| 13 | තාක්ෂණ අධ්‍යයනය | (5) සියනෑ | (9) මඩකලපුව | |
| 14 | චිත්‍ර | (12) වයඹ | (8) අඩ්ඩාලච්චේන<br>(9) මඩකලපුව<br>(15) යාපනය | |
| 15 | නැටුම් (පෙරදිග) | (12) වයඹ | | |
| 16 | නැටුම් (භරත) | | (7) ශ්‍රීපාද<br>(9) මඩකලපුව<br>(15) යාපනය | |

| පාඨමාලා අංකය | පාඨමාලාවේ නම | මාධ්‍ය අනුව එක් එක් පාඨමාලාව පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සහ ඒවායේ අංකය | | |
|---|---|---|---|---|
| | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| *i* | *ii* | *iii* | *iv* | *v* |
| 17. | සංගීතය (පෙරදිග) | (12) වයඹ | | |
| 18. | සංගීතය (කර්ණාට) | | (7) ශ්‍රීපාද<br>(9) මඩකලපුව<br>(15) යාපනය | |
| 19. | බටහිර සංගීතය | | | (3) මහවැලි |
| 20. | නාට්‍ය හා රංග කලාව | (12) වයඹ | (9) මඩකලපුව<br>(15) යාපනය | |
| 21. | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | | | (5) සියනෑ<br>(7) ශ්‍රීපාද<br>(13) රුවන්පුර<br>(16) දර්ගා නගර |
| 22. | සමාජීය විද්‍යාව | (14) රුහුණ | (6) වවුනියා<br>(7) ශ්‍රීපාද<br>(9) මඩකලපුව | |
| 23. | පළමුබස (දෙමළ) | | (7) ශ්‍රීපාද<br>(16) දර්ගා නගර | |
| 24. | දෙවන බස (සිංහල) | (3) මහවැලි | | |
| 25. | දෙවන බස (දෙමළ) | | (3) මහවැලි | |

*(සැලකිය යුතුයි :*

i. දෙමළ මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වෙන දර්ගා නගර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට අයදුම්කළ යුත්තේ කාන්තාවන් පමණි.

ii. භරත නැටුම්, කර්ණාට සංගීතය, දෙමළ මාධ්‍යයෙන් පමණක් ද, බටහිර සංගීතය, තොරතුරු සන්නිවේදන තාක්ෂණය, ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් ද පැවැත්වේ.)

6.0 2010 වර්ෂය සඳහා ශික්ෂණලාභීන් තෝරා ගැනීමේ පටිපාටිය

**6.1 තෝරා ගැනීමේ පදනම :**

6.1.1 2013 වසරේ පාසැල් පද්ධතියේ ගුරු අවශ්‍යතාව පදනම් කරගෙන බඳවා ගන්නා ශික්ෂණලාභීන් සංඛ්‍යාව තීරණය කර ඇත.

6.1.2 බඳවා ගැනීමේ මූලික පදනම Z ලකුණු කුසලතාව වේ. ඉංග්‍රීසි/තොරතුරු සන්නිවේදන තාක්ෂණය/ශාරීරික අධ්‍යාපනය පාඨමාලාව තෝරා ගැනීමේ දී ප්‍රවීණතා පරීක්ෂණය/ක්‍රීඩා කුසලතාව අනුව තෝරාගනු ලැබේ. ප්‍රවීණතා/ක්‍රීඩා කුසලතා එකම ලකුණක සිසුන් කිහිප දෙනෙකු අතරින් එක් අයෙකු තෝරා ගැනීමට සිදුවන අවස්ථාවක Z ලකුණු කුසලතාව බලපැවැත්වේ. ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය හැර අනෙකුත් සියළුම විද්‍යාපීඨවල පවත්වන පාඨමාලා සඳහා ජාතික මට්ටමෙන් 40% ක් ද, දුෂ්කර මට්ටමෙන් 60% ක් ද තෝරාගනු ලැබේ.

6.1.3 විද්‍යාව, ගණිතය, බටහිර සංගීතය හා තොරතුරු සන්නිවේදන තාක්ෂණය යන පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරීමට ඉල්ලුම්කරන අයදුම්කරුවන් ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍ය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ද, ඉංග්‍රීසි පාඨමාලාව හැදෑරීමට ඉල්ලුම්කරන අයදුම්කරුවන් අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට අධි සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍ය විෂයයට සම්මාන සාමාර්ථයක් ද, සහිතව සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ඇතුළුව හර විෂයය හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත් වීම අවශ්‍ය වේ.

6.1.4 ශාරීරික අධ්‍යාපනය, සංගීතය (කර්ණාට), නැටුම් (භරත) සහ බටහිර සංගීතය පාඨමාලාව සඳහා පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයේදී යෝග්‍යතාවය පිළිබඳව සතුටුදායක කුසලතා මට්ටමකට ළඟා විය යුතුය.

**6.2 දුෂ්කර දිස්ත්‍රික්ක පදනම :**

6.2.1 දුෂ්කර දිස්ත්‍රික්කය සඳහා බඳවා ගනු ලබන්නේ අධ්‍යාපන පහසුකම් බෙදීයාම අනුව දුෂ්කර යැයි සලකනු ලබන දිස්ත්‍රික්ක 17 ට අයත් අයදුම්කරුවන් ගෙනි.

(මාතලේ, මුලතිව්, අනුරාධපුරය, නුවරඑළිය, වව්නියාව, පොළොන්නරුව, හම්බන්තොට, ත්‍රිකුණාමලය, බදුල්ල, යාපනය, මඩකලපුව, මොණරාගල, කිලිනොච්චිය, අම්පාර, රත්නපුර, මන්නාරම, පුත්තලම)

එක් එක් දිස්ත්‍රික්කයෙන් ඒ ඒ මාධ්‍යයෙන් 2008 අ.පො.ස. (උ. පෙළ) විභාගයට පෙනී සිටි ශිෂ්‍ය ගහණයේ සමානුපාතයට සෑම පාඨමාලාවකටම ඒ ඒ දිස්ත්‍රික්කයන් ගෙන් බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

6.2.2 එක් එක් දුෂ්කර දිස්ත්‍රික්කය සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොසිටි අවස්ථාවකදී වෙනත් දිස්ත්‍රික්ක වලින් පුරප්පාඩු පුරවනු ලැබේ.

6.2.3 **දිස්ත්‍රික්ක නිර්ණය කිරීම**

6.2.3.1 යම් පාසල් අපේක්ෂකයෙකුගේ දිස්ත්‍රික්කය වන්නේ පළමුවරට අ.පො.ස. (උ. පෙළ) විභාගයට පෙනී සිටි මාසයට පෙරාතුව වූ මාසය දක්වා වූ වසර 5 තුළ සම්පූර්ණ කාලය හෝ වැඩිම කාලයක් (අවුරුදු 2 1/2 ට වැඩි) ඔහු/ඇය ඉගෙනීම කළ පාසල/පාසැල් පිහිටා ඇති දිස්ත්‍රික්කයයි.

6.2.3.2 යම් පෞද්ගලික අපේක්ෂකයෙකු ඊට ප්‍රථමයෙන් පාසැල් අපේක්ෂකයෙකු වශයෙන් පළමුවරට අ.පො.ස. (උ. පෙළ) විභාගයට පෙනීසිට පාසල හැර ගොස් ඇති අවස්ථාවක එකී අපේක්ෂකයාගේ දිස්ත්‍රික්කය වන්නේ ප්‍රථමයෙන් එකී විභාගයට පෙනී සිටි පාසල පිහිටි දිස්ත්‍රික්කයයි.

6.2.3.3. යම් පෞද්ගලික අපේක්ෂකයෙකු යම් හෙයකින් පාසැල් අපේක්ෂකයෙකු වශයෙන් අ.පො.ස. (උ. පෙළ) විභාගයට කලින් පෙනී නොසිට පාසැල් හැර ගොස් ඇති අවස්ථාවක එකී අපේක්ෂකයාගේ දිස්ත්‍රික්කය වන්නේ අ.පො.ස. (උ. පෙළ) විභාගයට පළමුවරට පෙනීසිටි මාසයට පෙරාතුවම වූ මාසයේ අවසාන දිනය දක්වා ඇති වර්ෂ 05 තුළ වැඩිම කාලයක් (අවුරුදු 2 1/2 කට වැඩි) අධ්‍යාපනය ලැබූ පාසල හෝ පාසැල් පිහිටා ඇති දිස්ත්‍රික්කයයි.

6.2.3.4 පාසලක අධ්‍යාපනය නොලැබූ පෞද්ගලික අපේක්ෂකයෙකු නම් ග්‍රාමසේවා නිලධාරි හා ප්‍රාදේශීය ලේකම්ගේ දිවුරුම් ප්‍රකාශයක් හෝ මැතිවරණ දෙපාර්තමේන්තුවේ ඡන්ද හිමි නාම ලේඛනය මගින් පමණක් ඉහත දිස්ත්‍රික්කයට පදිංචිය තහවුරු කළ යුතුය.

6.3 **ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට තෝරා ගැනීම**

6.3.1 පුරප්පාඩු සංඛ්‍යාවෙන් 75% ක් ඉන්දියානු ද්‍රවිඩ සම්භවය ඇති අයදුම්කරුවන්ගෙන් ද, 25% ක් සිංහල අයදුම්කරුවන්ගෙන් ද පුරවනු ලැබේ.

6.3.1.1 වතු පාසැල් පිහිටි දිස්ත්‍රික්කවල පවත්නා පුරප්පාඩුවල ප්‍රමාණාත්මක භාවය අනුව සිසුන්ගෙන් 35% ක් මොණරාගල, බදුල්ල සහ රත්නපුර යන දිස්ත්‍රික්කවලට වෙන් කෙරේ.

6.3.2 දෙමළ මාධ්‍ය පාඨමාලා සඳහා 75% ක් ද, සිංහල මාධ්‍ය පාඨමාලා සඳහා 25% ක් ද තෝරා ගනු ලැබේ.

6.3.3 ප්‍රාථමික, ගණිතය, විද්‍යාව, යන පාඨමාලා සිංහල මාධ්‍යයෙන්ද, ප්‍රාථමික, ගණිතය, විද්‍යාව, කර්ණාට සංගීතය, භරත නැටුම්, සමාජීය විද්‍යාව, පළමු බස (දෙමළ) යන පාඨමාලා දෙමළ මාධ්‍යයෙන් ද, තොරතුරු සන්නිවේදන තාක්ෂණය ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද පැවැත්වේ. (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ පැවැත්වෙන්නේ ඉහත පාඨමාලා පමණි.)

6.3.4 ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට ඉල්ලුම් කළ යුත්තේ නුවරඑළිය, මහනුවර, මාතලේ, බදුල්ල, මොණරාගල, රත්නපුරය, කෑගල්ල, කළුතර, මාතර, ගාල්ල සහ කුරුණෑගල යන වැවිලි දිස්ත්‍රික්කවල පදිංචි වැවිලි අංශයේ සේවයේ නියුතු අයගේ දරුවන් පමණි. වතු අංශයේ සේවය කරන අයගේ දරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති විටක, දැනට වතු අංශයේ සේවය නොකළ ද 1999 හෝ ඊට පසු වර්ෂවල වතු අංශයේ අවම වශයෙන් වසර 05 ක් සේවය කළ අයගේ දරුවන් පිළිබඳව සලකා බලනු ලැබේ. (ප්‍රමුඛතාව හිමිවන්නේ 2008, 2007, 2006 ආදී වශයෙන් අනුපිළිවෙලිනි.) යම් දෙමළ මාධ්‍ය පාඨමාලාවකට ඉහත අයදුම්කරුවන් අතුරින් සුදුසුකම් ලබන ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් වෙනත් දිස්ත්‍රික්ක වල පදිංචි ඉන්දියානු සම්භවයක් ඇති දෙමළ මාධ්‍ය අයදුම්කරුවන් පිළිබඳව සලකා බලනු ලැබේ. එහෙත් ඔවුන් අ.පො.ස. (උ. පෙළ) විෂයයන් 03 ක් සමත්වීම අනිවාර්ය වේ. සිංහල මාධ්‍ය පාඨමාලාවලට වැවිලි දිස්ත්‍රික්කවල පදිංචි වැවිලි අංශයේ පදිංචිකරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති වුවහොත් ඉතිරි පුරප්පාඩු පුරවනු ලබන්නේ වෙනත් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ වල එම පාඨමාලාවලට අයදුම්කර ඇති අයදුම්කරුවන් අතුරින්ය.

6.3.5 රාජ්‍ය හා ලියාපදිංචි පෞද්ගලික වතු සමාගම් වල සේවකයන්ගේ දරුවන් ඒ බව තහවුරු කිරීම සඳහා වතු අධිකාරීගේ ලිපිය (සේවකයා සේවය කළ දින වකවානු සහිතව) පසුගිය වසර 05 ක් හෝ ඊට වැඩි කාලයක් වතුවල ස්ථිරව පදිංචිව සිටින බවට/වතු සේවයේ යෙදී සිටි විශ්‍රාම ගිය වර්ෂය සහ දිනය පැහැදිලිව සඳහන් වන, වතු අධිකාරී විසින් සහතික කරන ලද ලිපිය පුහුණුවෙන් පසුව වතු අංශයේ පාසැල්වල අඛණ්ඩව වසර 10 ක් අනිවාර්යයෙන් සේවය කරන බවට පොරොන්දු වන ලිපියක් හා සේවක අර්ථසාධක අරමුදලට අය කිරීම් කරන බව ලියාපදිංචි අංක සහිතව ඔප්පු කරන ලිපි සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුවේ. ඉල්ලුම්කරුගේ දිස්ත්‍රික්කය නිර්ණය කිරීමේ පදනම දැක්වෙන 6.2.2 ඡේදය ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට ඉල්ලුම්කරුවන් තෝරා ගැනීමේ දී ද අදාළ කරගනු ලැබේ.

6.3.6 අදාළ සෑම දිස්ත්‍රික්කයකින්ම අවම වශයෙන් එක් අයදුම්කරුවෙකුවත් තෝරා ගැනීම සඳහා සළකා බලනු ලැබේ.

*සැලකිය යුතුයි* - සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ ඉන්දියානු සම්භවයක් ඇති අයදුම්කරුවෙකු නම් ඉන්දියානු සම්භවයට හිමි ප්‍රතිශතය සඳහා සලකා බලනු ලැබේ. එමෙන්ම දෙමළ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහල අයදුම්කරුවෙකු නම් සිංහල මාධ්‍යය ප්‍රතිශතය සඳහා සළකා බලනු ලැබේ.

**7.0 තෝරා ගැනීමට අදාළ වෙනත් කරුණු**

7.1 තෝරාගනු ලබන අයදුම්කරුවන් අදාළ පාඨමාලාව සඳහා යෝග්‍යතාවය සනාථ කිරීමට පිළිගත හැකි සාක්ෂි සහ සහතිකවල මුලික පිටපත් සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනට ඉදිරිපත් කිරීමට සූදානම්ව සිටිය යුතුය. පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

7.2 සියලුම සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණ දිනට ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් තෝරා ගනු නොලැබේ.

7.3 පාඨමාලාවේ අපේක්ෂිත මට්ටමකට ළඟා වීමට අයදුම්කරුවන් වෙත තිබිය යුතු කායික මානසික යෝග්‍යතාව පිළිබඳ ගැටළු තත්ත්වයන් නිරීක්ෂණය වූ අවස්ථාවක එකී තත්ත්වයන් පිළිබඳ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සෑහීමකට පත් නොවේ නම් විශේෂ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක පරීක්ෂණයකට භාජනය කොට එහි වාර්තාව අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලයට ඉදිරිපත් කර ලබා ගන්නා තීරණ ක්‍රියාත්මක කරනු ඇත.

7.4 තෝරා ගනු ලබන අයදුම්කරුවන් අදාළ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ ලියාපදිංචි වීමට නියමිත දිනයේ සිට දින 03 ක් ඇතුළත ලියාපදිංචි නොවුවහොත් ඇතුළත්වීමේ අවස්ථාව ඔහුට/ඇයට අහිමි වනු ඇත. මේ අනුව ඇති වන පුරප්පාඩු කුසලතා අනුපිළිවෙලට පුරවනු ලැබේ.

7.4.1 එබැවින් නියමිත දිනට ලියාපදිංචි නොවන අයදුම්කරුවන් විසින් පසුව කරනු ලබන ඉල්ලීම් පිළිබඳව කිසිසේත්ම සලකා බැලීමට අවස්ථාව නොමැති බව අවධාරණය කෙරේ.

7.5 තෝරා ගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු මානසික හා කායික සෞඛ්‍යයෙන් යුක්ත දැයි පරීක්ෂාකර බැලීම සඳහා විද්‍යාපීඨවලට ඇතුළත් වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු වේ.

7.6 යම් පාඨමාලාවකට/ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයකට තෝරා ගත් පසු ඒ පාඨමාලාව/ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. කිසියම් පාඨමාලාවකට ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් නොමැති අවස්ථාවක ළඟම ඇති විද්‍යාපීඨයකට අදාළ පාඨමාලාව හැදෑරීමට මාරු කරනු ලැබේ.

7.7 යම්කිසි පාඨමාලාවක් සඳහා තෝරා ගැනීමේ දී අ. පො. ස. (උ. පෙළ) විභාගයේදී යම්කිසි එකම ලකුණක් ලබා ගෙන ඇති අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව තවදුරටත් තෝරා ගත යුතු පුරප්පාඩු සංඛ්‍යාවට වැඩිනම්, අදාළ අයදුම්කරුවන්ගේ පළමු වරට අ.පො.ස. (සා. පෙළ) විභාගයට ඉදිරිපත් වූ ප්‍රතිඵල සැලකිල්ලට භාජනය කෙරේ. විශිෂ්ඨ සාමාර්ථයකට ලකුණු 03 ක් ද, සම්මාන සාමාර්ථයකට ලකුණු 02 ක්ද, සාමාන්‍ය සාමාර්ථයකට ලකුණු 01 ක්ද, බැගින් ලකුණු ප්‍රදානය කොට සමස්ත ලකුණු සංඛ්‍යාව පදනම් කර ගනිමින් නියමිත පුරප්පාඩු සංඛ්‍යාව පුරවනු ලැබේ. මෙම ලකුණු දීම ප්‍රධාන විෂයයන් 08 කට පමණක් සීමා කෙරේ.

**8.0 පාඨමාලා සඳහා අයදුම් කිරීමට හෝ ඇතුළත් වීමට නුසුදුස්සන්**

8.1 දැනටමත් රජයේ හෝ පෞද්ගලික පාසැල්වල ගුරු පත්වීම් ලබා ඇති අය,

8.2 රජයේ පාසලක පත්වීමක් සඳහා තෝරා ගනු ලැබ සිටින අය,

8.3 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක පාඨමාලාවක් හදාරන හෝ හැදෑරූ අය,

8.4 විශ්ව විද්‍යාලයක/විශ්ව විද්‍යාල විද්‍යායතනයක/වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක/අ.පො.ස. (උ. පෙළ) සුදුසුකම් වලින් බඳවා ගන්නා පාඨමාලාවක ලියාපදිංචි/හදාරමින් සිටින හෝ උපාධි පාඨමාලාවක් හදාරා අවසන් කළ අය. (දැනට ඉහත ආයතනයක ලියාපදිංචි වී සිටින සිසුන් ලියාපදිංචිය අවලංගු කර ගත්තද ඔවුහු අයදුම් කිරීමට සුදුසුකම් නොලබති.)

8.5 විනයානුකූල හේතූන් මත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයකින් ඉවත් කරනු ලැබූ අය.

**9.0 පුහුණුව සඳහා අදාළ කොන්දේසි :**

9.1 පුහුණු පාඨමාලාවක කාල සීමාව අවුරුදු තුනකි. එය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ අවුරුදු දෙකක නේවාසික ආයතනික පුහුණුවකින් ද, පාසලකට අනුයුක්තව සිදු කෙරෙන වසරක සීමාවාසී පුහුණුවකින්ද සමන්විත වේ. දෙවන වසර අවසානයේ දී විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන බාහිර අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා ශික්ෂණලාභියාගේ පැමිණීම 90% කට නොඅඩු විය යුතුය.

9.2 සෑම ශික්ෂණලාභියෙකු ම පළමු වසරේ සහ දෙවන වසරේ පවත්වනු ලබන අභ්‍යන්තර අඛණ්ඩ පරීක්ෂණ වලින් ද දෙවන වසර අවසානයේ පවත්වනු ලබන අභ්‍යන්තර පරීක්ෂණ වලින් ද ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන අවසාන බාහිර විභාගයෙන් ද සමත් විය යුතුයි. එමෙන්ම ඉංග්‍රීසි මාධ්‍යය පාඨමාලාව හදාරණ අය හැර අනෙක් සියළුම පාඨමාලා හදාරන අය ඉහත විභාග වලදී ඉංග්‍රීසි විෂයයෙන් සමත් විය යුතුය. ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ එම කොන්දේසි වලට එකඟ වන අය පමණි.

9.3 ශික්ෂණලාභියෙකුට නේවාසික පුහුණුව ලබන වර්ෂ දෙක තුළ දී වර්ෂයකට මාස 10 ක් සඳහා මාසයකට රු. 2,000 ක වටිනාකමින් යුත් ආහාරපාන හා නේවාසික පහසුකම් සපයනු ලැබේ. සීමාවාසි වර්ෂය තුළ දී මාස 10 ක් සඳහා මාසයකට රු. 2,500 බැගින් යුත් දීමනාවක් ගෙවනු ලැබේ. පෞද්ගලික අවශ්‍යතාවලට අදාළ සෙසු වියදම් ශික්ෂණලාභියා විසින් දැරිය යුතුය.

9.4 පුහුණුවන කාල සීමාව තුළ දී ශික්ෂණලාභියා විශ්ව විද්‍යාලයක, විශ්ව විද්‍යාල විද්‍යායතනයක, වෙනත් ආයතනයක උසස් පෙළ සුදුසුකම්වලින් බඳවා ගන්නා පාඨමාලාවක, අභ්‍යන්තර ශිෂයෙකු වශයෙන් අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීමට කිසිසේත් අවසර දෙනු නොලැබේ. එසේ පාඨමාලාවක නිරත වන බව සනාථ වුවහොත් ශික්ෂණලාභිය වෙනුවෙන් දරන ලද වියදම ආපසු අය කරගෙන පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ.

9.5 පුහුණුවන කාල සීමාව තුළ දී ශික්ෂණලාභියා විවාහවුවහොත් ශිෂ්‍ය භාවය අවලංගු කරනු ලැබේ. භික්ෂූන් වහන්සේලා/පූජකවරුන් ලියාපදිංචි වීමෙන් පසු උපැවිදි වුවහොත් පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ. පුහුණුව අවසන් කළ පසු සෑම ආගමකටම අයත් පූජ්‍ය පක්ෂය උපැවිදි නොවී අවම වශයෙන් අවුරුදු 05 ක් අධ්‍යාපන අමාත්‍යාංශයට සේවය කරන බවට අමාත්‍යාංශය සමග ගිවිසුමකට එළඹිය යුතුයි.

9.6 පුහුණුවන කාල සීමාව තුළ අපේක්ෂිත හැසිරීම. උද්යෝගය හා අධ්‍යයන කටයුතුවල ප්‍රගතිය නොපෙන්වන ශික්ෂණලාභියෙකු පුහුණුවෙන් ඉවත් කරනු ලැබේ. එසේම ශාස්ත්‍රීය පුහුණුවේ ප්‍රථම වර්ෂය තුළ දී කරනු ලබන ඇගයීමේ දී සතුටුදායක මට්ටමකට එළඹීමට අසමත් හෝ 9.4 ඡේදයේ දැක්වෙන පාඨමාලාවක් හදාරන බව සනාථ වුවහොත් පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ. මේ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන විද්‍යායතනික මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වනු ඇත.

9.7 පුහුණුවන කාල සීමාව තුළ දී ශික්ෂණලාභියාගේ කායික හා මානසික යෝග්‍යතාව සම්බන්ධයෙන් පීඨාධිපතිගෙන් හෝ සීමාවාසී කාල සීමාව තුළ විදුහල්පතිගෙන් පැමිණිලි ලැබේ නම් නැවත විශේෂ සම්මුඛ පරීක්ෂණයකට ඉදිරිපත් කරනු ලැබේ. එහි වාර්තාව අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලයට ඉදිරිපත් කර අවසාන තීරණය ගනු ලැබේ.

9.8 පුහුණුව සඳහා නියමිත අවුරුදු තුනේ කාල සීමාව සම්පූර්ණ කිරීමට පෙර පුහුණුව අත්හරින්නේ නම් පුහුණු කිරීම වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයට වැය වූ මුදල ආපසු අමාත්‍යාංශයට ගෙවන බවට ශික්ෂණලාභීන් විසින් අධ්‍යාපන අමාත්‍යාංශය සමග ගිවිසුමකට ඇතුළත් විය යුතු වේ.

9.9 පුහුණු පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කරන ශික්ෂණලාභීන්ට ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව ප්‍රදානය කරනු ලැබේ. පාඨමාලාශ්‍රිත වැඩ හා පෞරුෂ වර්ධනය (අනිවාර්යයෙන්ම සහභාගි විය යුතු විෂයය සමගාමී කටයුතු ඇතුළු) පුහුණුවීම් කාලය තුළ දී අඛණ්ඩ ලෙස අගයනු ලබන අතර, මේ ඇගයීම් ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව ප්‍රදානය කිරීම සඳහා කරනු ලබන අවසාන ඇගයීමේ කොටසක් වනු ඇත.

9.10 මෙම පාඨමාලාවන් සාර්ථක ලෙස සම්පූර්ණ කරන අයදුම්කරුවන් පුරප්පාඩු පවත්නා දුෂ්කර දිස්ත්‍රික්කවල අධ්‍යාපන කලාප මට්ටමින් ඇති වන ඇබෑර්තු පදනම් කර ගෙන ගුරු පත්වීම් ලබා දීම සඳහා සලකා බලනු ලැබේ.

9.10.1 ගණිතය, විද්‍යාව, වැනි පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ශික්ෂණලාභීන් ඔවුන් පත්වීම් ලබන පාසලෙහි ඉංග්‍රීසි මාධ්‍ය ඇබෑර්තු නොමැති වුවහොත් තම මවු බසින් (සිංහල/දෙමළ මාධ්‍යයෙන්) ඉගැන්වීම කළ යුතු වේ.

9.10.2 අනාගතයේ දී රජයේ පාසල්වලට ගුරු පත්වීම් දීමේ දී මෙම පුහුණු පාඨමාලා සම්පූර්ණ කළ අයට ප්‍රමුඛත්වය ලැබෙනු ඇත. එබැවින් පාඨමාලා සඳහා තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණවලට කැඳවීම් ලබන අයදුම්කරුවන් ඉහත කොන්දේසිවලට එකඟවන්නේ නම් පමණක් සම්මුඛ පරීක්ෂණවලට ඉදිරිපත් විය යුතුවේ.

9.10.3 ඉහත කොන්දේසි යටතේ පුහුණුව ලබන අයදුම්කරුවන් තමා පත්වීම් ලබන දුෂ්කර දිස්ත්‍රික්කයේ/අධ්‍යාපන කලාපයේ අවම වශයෙන් පත්වීම් දින සිට පස් අවුරුද්දක් (05) අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවය කරන බවට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සමග ගිවිසුමකට බැඳිය යුතුය. පත්වීම් ලබා දෙන අධ්‍යාපන කලාපය කිසිසේත් වෙනස් කරනු නොලැබේ.

9.11 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක ලියාපදිංචි වන අයදුම්කරුවන්ට පුහුණුවට වැයවන මුදල සහ වෙනත් යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් රු. 5,00,000 ක බැඳුම්කරයකට අත්සන් කළ යුතුය. පාඨමාලාව අතරමග නවතා ඉවත්වන හෝ පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව වසර 05 ක් රජය යටතේ සේවය නොකරන අයෙකු මෙම බැඳුම්කරයෙහි සම්පූර්ණ මුදල රජයට ගෙවීමේ කොන්දේසියකට යටත් වේ.

9.12 සියලුම අධ්‍යාපන හා සෙසු සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනයට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතුය.

10.0 *අයදුම් කිරීම* :

10.1 එක් අයදුම්කරුවෙකුට උපරිම වශයෙන් පාඨමාලා තුනකට (03) අයදුම් කළ හැකිය. එකම පාඨමාලාවකට මාධ්‍යය දෙකකින් අයදුම් කළහොත් එය ද පාඨමාලා දෙකකට අයදුම් කළාසේ සැළකේ. එවැනි අයදුම්කරුවෙකුට තවත් එක් පාඨමාලාවකට පමණක් අයදුම් කළ හැකිය. බෞද්ධ භික්ෂූන් වහන්සේලා බුද්ධ ධර්මය පාඨමාලාවට ද, කතෝලික, හින්දු, ඉස්ලාම් පූජක තුමන්ලා අදාළ ආගමික පාඨමාලාවලට ද පමණක් අයදුම් කළ යුතුය.

*උදා :* විද්‍යාව පාඨමාලාව සිංහල මාධ්‍යය සහ විද්‍යාව පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යය යන දෙකටම අයදුම්කළ අයදුම්කරුවෙකුට අයදුම් කළ හැක්කේ තවත් එක් පාඨමාලාවකට පමණි.

10.2 එක් අයදුම්කරුවෙකු විසින් එක් අයදුම්පත්‍රයක් හා එහි සහතික කළ ඡායා පිටපත් දෙකක් (02) පමණක් එකම කවරයක බහා ඉදිරිපත්කළ යුතුය. එක් අයදුම්කරුවෙකු විසින් ඉහත ඉල්ලුම්පත් හා සහතික කළ ඡායා පිටපත් දෙක හැර වෙනත් ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇත්නම් සියළුම ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10..3 අයදුම්පත්‍රය පහත දැක්වෙන උපදෙස් හා ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කළ යුතුය.

10.4 අයදුම්පත්‍ර 2009.09.25 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන), විද්‍යාපීඨ ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**අයදුම් පත්‍රය බහා එවන කවරයේ ආදර්ශය පහත දැක්වේ.**

<table>
<tr><td colspan="2">2010 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ඇතුළත්වීම සඳහා අයදුම්පත්‍රය,<br>පළමු මනාපය ලෙස දක්වා ඇති පාඨමාලා අංකය .........මාධ්‍යය.........<br>ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට ඉල්ලුම් කරන්නේ ද ඔව්/නැත.</td></tr>
<tr><td></td><td>ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන)<br>විද්‍යාපීඨ ශාඛාව,<br>අධ්‍යාපන අමාත්‍යාංශය,<br>ඉසුරුපාය,<br>බත්තරමුල්ල.</td></tr>
</table>

10.5 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට බඳවා ගැනීම සම්බන්ධයෙන් විමසීමක් හෝ අභියාචනයක් ඉදිරිපත් කරන සෑම අවස්ථාවක දීම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කළ ලියාපදිංචි තැපැල් කුවිතාන්සිය සහ ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතුය. එම නිසා ඒවා අයදුම්කරු ළඟ තබා ගත යුතුය.

10.6 විභාග අංකය, වර්ෂය, පාඨමාලා අංකය නිවැරදිව ඇතුළත් නොකරන ලද හා අසම්පූර්ණ අවිධිමත් අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10.7 අයදුම්පත්‍ර ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

10.8 අයදුම්පත්‍රයට වෙනත් කිසිදු ලියවිල්ලක් අමුණා නොඑවිය යුතුය.

10.9 අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන සහතික කූට හෝ වංචනික හෝ සහතිකයක් බවට පසුව හෙළි වුවහොත් අයදුම්කරු සේවයෙන් පහ කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ කිසිම පත්වීමක් සඳහා නුසුදුස්සෙකු වනු ඇත.

11.0 *ගැසට් නිවේදනයේ* ඉහත සඳහන් තොරතුරු මත මතුවන ගැටළු පිළිබඳව අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

12.0 මෙම ගැසට් නිවේදනයෙහි සිංහල හා දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨමාලා අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වේ.

එම්. එම්. එන්. ඩී. බණ්ඩාර,<br>ලේකම්,<br>අධ්‍යාපන අමාත්‍යාංශය.

2008 අගෝස්තු මස 25 වැනි දින,<br>අධ්‍යාපන අමාත්‍යාංශය,<br>ඉසුරුපාය,<br>බත්තරමුල්ල.

**අයදුම්පත පිළියෙල කිරීම සඳහා උපදෙස්**

1.0 *ගැසට් නිවේදනය* කීපවරක් සැලකිල්ලෙන් කියවන්න. ඔබට සුදුසුකම් ඇති පාඨමාලා තුනකට එක් අයදුම්පත්‍රයක පමණක් අයදුම් කරන්න. මෙම අයදුම්පත්‍රය හා එහි සහතික කළ ඡායා පිටපත් දෙකක් පමණක් එකම කවරයක බහා ඉදිරිපත් කරන්න. (පාසල් අයදුම්කරුවන් විදුහල්පති මගින් ද, පෞද්ගලික අයදුම්කරුවන් සාමදාන විනිශ්චයකරුවකු මගින් ද ඡායා පිටපත් දෙක සහතික කරවා ගත යුතුය.)

2.0 පහත දැක්වෙන ආදර්ශය අනුව A4 ප්‍රමාණයේ (සෙන්ටි මීටර් 21 x සෙන්ටි මීටර් 29.7 ) සුදු කඩදාසියක අයදුම්පත පිළියෙල කරන්න. 1.0 - 9.4 දක්වා ඡේද පළමුවන පිටුවට ඇතුළත්වන සේ සකස් කරන්න. කොටුවක් තුළ තොරතුරු දැක්විය යුතු අවස්ථාවල දී අදාළ කොටුව තුළ "X"ලකුණ යොදන්න.

3.0 අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීම සඳහා එක් එක් පාඨමාලා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය පිළියෙල කරන පරිගණක නාමාවලි සකස් කරන්නේ පළමු පිටුවේ දැක්වෙන 1.0-9.4 දක්වා තොරතුරු පදනම් කරගෙන බව කරුණාවෙන් සළකන්න. විශේෂයෙන්ම පාඨමාලාවේ අංකය, අ.පො.ස (උ.පෙළ) විභාග අංකය, Z අගය නිවැරදි බවට තහවුරු කරගන්න. අංක එක උඩ එක ලිවීමෙන් හෝ නොපැහැදිලිව ලිවීමෙන්, වැරදි ලෙස ලිවීමෙන් ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බව කරුණාවෙන් සලකන්න.

4.0 ශාරීරික අධ්‍යාපනය පාඨමාලාව සඳහා ඉල්ලුම්පත්‍රයේ 12.0 ඡේදය ද, බුද්ධ ධර්මය පාඨමාලාව සඳහා ඉල්ලුම්පත්‍රයේ 13.0 ඡේදය ද, කතෝලික/ක්‍රිස්තියානි ධර්මය පාඨමාලාව සඳහා ඉල්ලුම්පත්‍රයේ 14.0 ඡේදය ද, හින්දු ධර්මය/ඉස්ලාම් ධර්මය පාඨමාලාව සඳහා ඉල්ලුම්පත්‍රයේ 15.0 ඡේදය ද, තාක්ෂණ අධ්‍යයනය සඳහා 16.0 ඡේදය ද, බටහිර සංගීතය සඳහා 17.0 ඡේදය ද දක්වා ඇති තොරතුරු සැලකිල්ලට ගැනේ. ඒ නිසා ඒවා නිවැරදිව පිරවිය යුතුයි. ඒවා පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

5.0 දිස්ත්‍රික්කවලට නියමිත අංක මෙසේය ඃ

| | | | | | |
|---|---|---|---|---|---|
| කොළඹ | 01 | හම්බන්තොට | 09 | අම්පාර | 17 |
| ගම්පහ | 02 | යාපනය | 10 | පුත්තලම | 18 |
| කළුතර | 03 | කිලිනොච්චිය | 11 | කුරුණෑගල | 19 |
| මාතලේ | 04 | මන්නාරම | 12 | අනුරාධපුරය | 20 |
| මහනුවර | 05 | මුලතිව් | 13 | පොළොන්නරුව | 21 |
| නුවරඑළිය | 06 | වවුනියාව | 14 | බදුල්ල | 22 |
| ගාල්ල | 07 | ත්‍රිකුණාමලය | 15 | මොණරාගල | 23 |
| මාතර | 08 | මඩකලපුව | 16 | කෑගල්ල | 24 |
| | | | | රත්නපුර | 25 |

6.0 මාධ්‍යය සඳහා අදාළ සංකේත මෙසේය ඃ සිංහල -S , දෙමළ - T ඉංග්‍රීසි - E.

*ආදර්ශ අයදුම්පත්‍රය*

**ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ඇතුළත් කර ගැනීම - 2010**

(අයදුම්කරුවෙකු එක් අයදුම්පතක් හා එහි සහතික කළ ඡායා පිටපත් දෙකක් පමණක් එකම කවරයක බහා ඉදිරිපත් කළ යුතුය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන ලෙස සකස් කළ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රයේ 9 වැනි ඡේදය දක්වා තොරතුරු පළමු පිටුවට ඇතුළත් කරන්න. තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ සඳහා පරිගණක නාමාවලිය සකස් කරන්න. 1.0-9.4 දක්වා තොරතුරු ඇසුරෙනි.)

1.0

| *මනාපය* | *පාඨමාලාවේ අංකය* | *ජා. අ. වි. පීඨයේ අංකය* | *පාඨමාලාවේ මාධ්‍යය* S/T/E | *පාඨමාලා අංක (21) විභාගයට පෙනී සිටින මාධ්‍යය* S/T/E |
|---|---|---|---|---|
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | | |

2.0 2.1 මුලකුරු සමඟ නම ඉංග්‍රීසියෙන් (In Block letters) **නිදසුන** : Mr. PERERA R. C.
Mr./Miss :——————.

2.2 සම්පූර්ණ නම ඉංග්‍රීසියෙන් (In Block letters) :——————.

3.0 ස්ථිර පදිංචි ලිපිනය ඉංග්‍රීසියෙන් (In Block letters) :——————.

දුරකථන අංකය :——————.

4.0 ගැසට් නිවේදනයේ 6.2.3 ඡේදයට අනුව දිස්ත්‍රික්කය :——————. දිස්ත්‍රික් අංකය : ☐

5.0 5.1 උපන් දිනය :

අවුරුද්ද : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

5.2 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

6.0 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ [1] ස්ත්‍රී [2]

7.0 ජන වර්ගය :

| සිංහල | ශ්‍රී ලංකා ද්‍රවිඩ | ඉන්දියානු සම්භවයක් සහිත ද්‍රවිඩ | මුස්ලිම් | වෙනත් |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |

8.0 2008 වර්ෂයේ අ.පො.ස (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල :

8.1 වර්ෂය : | | | | | විභාගයට පෙනී සිටි මාධ්‍ය ః …………

8.2 විභාග අංකය : | | | | | | | | |

8.3 Z අගය : | | | | | | | Z අගය සෘණ නම් අදාළ කොටුවේ M අක්ෂරය යොදන්න | |

8.4 ප්‍රතිඵල විස්තරය විෂයය අනුව :

| විෂයය | විෂයය අංකය | ලැබූ ශ්‍රේණිය |
|---|---|---|
| 1............................................... | ......................... | ......................... |
| 2............................................... | ......................... | ......................... |
| 3............................................... | ......................... | ......................... |

9.0 9.1 ඉංග්‍රීසි සහ ඉංග්‍රීසි මාධ්‍ය පාඨමාලාවල අයදුම්කරුවන් අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට හෝ ඉංග්‍රීසි සාහිත්‍යයට ලැබූ

ඉහළම ශ්‍රේණිය : | | විෂයය අංකය : | | |

විභාග අංකය : | | | | | | | | | වර්ෂය: | | | | |

9.2 ඔබ ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට අයදුම්කරන්නේ ද ? ඔව් | 1 | නැත | 2 |

9.3 එසේ නම් වතු සේවක දරුවෙක් ද ? නැද්ද යන වග (අදාළ කොටුවේ X ලකුණෙන් දැක්විය යුතුයි.)

ඔව් | 1 | නැත | 2 |

9.4 ශාරීරික අධ්‍යාපනය සිංහල/දෙමළ අයදුම්කරුවන් තම අයදුම්පතෙහි 12.0 වගන්තිය සඳහා ඇතුළත් කරනු ලබන ලකුණුවල එකතුව : | |

10.0 2008 වර්ෂයට පෙර ඔබ අ.පො.ස (උ.පෙළ) විභාගයට පෙනී සිට ඇත්නම් ඔබ පෙනීසිටියේ එක් විෂයකට පමණක් වුව ද එක් එක් වාරයේ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න.

| | | |
|---|---|---|
| 10.1 විභාගයට පෙනී සිටි වාරය : | 1 | 2 |
| 10.2 වර්ෂය : | ................. | ................... |
| 10.3 විභාග අංකය : | ................. | ................... |
| 10.4 විභාග මධ්‍යස්ථානයේ අංකය : | ................. | ................... |
| 10.5 Z අගය ః | ................. | ................... |

10.6 සමත් වූ විෂයයන් හා ශ්‍රේණි :

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| ................... | ................... | ................... | ................... |
| ................... | ................... | ................... | ................... |
| ................... | ................... | ................... | ................... |

11.0 සමත් වූ අ.පො.ස (සා.පෙළ) පිළිබඳ විස්තර :

| | | | | |
|---|---|---|---|---|
| 11.1 | විභාගයට පෙනී සිටි වාරය : | 1 | 2 | 3 |
| 11.2 | වර්ෂය : | .................. | .................. | .................. |
| 11.3 | විභාග අංකය : | .................. | .................. | .................. |
| 11.4 | විභාග මධ්‍යස්ථානයේ අංකය : | .................. | .................. | .................. |
| 11.5 | සමත් වූ විෂයයන් හා ශ්‍රේණි : | .................. | .................. | .................. |

| *(1 වාරය)* | | *(2 වාරය)* | | *(3 වාරය)* | |
|---|---|---|---|---|---|
| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
| 1. ......................... | ....................... | ....................... | ....................... | ....................... | ....................... |
| 2. ......................... | ....................... | ....................... | ....................... | ....................... | ....................... |
| 3. ......................... | ....................... | ....................... | ....................... | ....................... | ....................... |
| 4. ......................... | ....................... | ....................... | ....................... | ....................... | ....................... |
| 5. ......................... | ....................... | ....................... | ....................... | ....................... | ....................... |
| 6. ......................... | ....................... | ....................... | ....................... | ....................... | ....................... |
| 7. ......................... | ....................... | ....................... | ....................... | ....................... | ....................... |
| 8. ......................... | ....................... | ....................... | ....................... | ....................... | ....................... |

12.0 ගැසට් නිවේදනයේ 4.4 ඡේදයේ 4.4.3 හා 4.4.4 වගන්තියට අනුව ක්‍රීඩා ප්‍රවීණතාව පිළිබඳ විස්තර :

(ශාරීරික අධ්‍යාපන පාඨමාලාවට අයදුම් කරන අය පමණක් පිරවිය යුතුය.) මෙම කොටස සම්පූර්ණ කිරීමේ දී 4.4.3 හි සියළු වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කළ යුතුය. ඔබ ලබා ඇති ඉහළම ක්‍රීඩා සහතික/නිපුනතා තුනක තොරතුරු පමණක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ. ඔබ අ.පො.ස (සා.පෙළ) විභාගයේ සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන විෂයයට පෙනී සිට සාමාර්ථ ලබා ඇත්නම් 4.4.4 ට අනුව ශ්‍රේණියට හිමි ලකුණු ද පහත කොටසෙහි සඳහන් කළ යුතුය. මුළු ලකුණුවල එකතුව මුල් පිටුවේ 9.4 හි ද ඇතුළත් කළ යුතුය.

| *අනු අංකය* | *වර්ෂය* | *නිකුත් කළ අමාත්‍යාංශය/ ආයතනය/ සංගමය* | *තරග නියෝජනය කළ මට්ටම:අන්තර්ජාතික/ජාතික/ පළාත්/දිස්ත්‍රික්කය/කලාප* | *ඉසව්ව/ක්‍රීඩාව* | *ලැබූ ස්ථානය* | *4.4.3 ට අදාළ ලකුණු* |
|---|---|---|---|---|---|---|
| 1 | | | | | | |
| 2 | | | | | | |
| 3 | | | | | | |
| අ.පො.ස (සා.පෙළ) සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන විෂයයට ලද ශ්‍රේණිය | | | | | ලකුණු | |
| | | | | මුළු එකතුව | | |

13.0 *ගැසට් නිවේදනයේ 4.7 වගන්තියේ (අ) අනුව ප්‍රාචීන ප්‍රාරම්භ, බෞද්ධ ධර්මාචාර්ය. පිරිවෙන් අවසාන විභාග ප්‍රතිඵල පිළිබඳ විස්තර ඇත්නම් ඇතුළත් කරන්න.*

| විභාගය | ප්‍රාචීන ප්‍රාරම්භ | බෞද්ධ ධර්මාචාර්ය | පිරිවෙන් අවසාන | දහම් පාසල් අවසාන |
|---|---|---|---|---|
| 13.1 වර්ෂය | | | | |
| 13.2 විභාග අංකය | | | | |
| 13.3 මධ්‍යස්ථාන අංකය | | | | |
| 13.4 විෂයය හා ශ්‍රේණිය | 1.<br>2.<br>3.<br>4. | 1.<br>2.<br>3.<br>4.<br>5.<br>6. | 1.<br>2.<br>3.<br>4.<br>5.<br>6.<br>7.<br>8.<br>9.<br>10<br>11. | |

14.0 ගැසට් නිවේදනයේ 4.10 ඡේදය අනුව කතෝලික/ක්‍රිස්තියානි ධර්මය අයදුම්කරුවන් විසින් අදාළ කොටස සම්පූර්ණ කළ යුතුයි.

| පාඨමාලාවේ නම/සහතිකය | හදාරන ලද කාලය | | |
|---|---|---|---|
| | සිට | දක්වා | ලබා ඇති සාමාර්ථය |
| 14.1 දේව ධර්මය පිළිබඳ පාඨමාලාව (BTH) | | | |
| 14.2 ජාතික දෙව්සත්හලේ කිතුනු දර්ශනය පිළිබඳ පාඨමාලා සහතිකය. | | | |
| 14.3 ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය මගින් පවත්වනු ලබන කතෝලික දහම් ගුරු සහතිකය | | | |
| 14.4 දේව ධර්ම නිකේතනය මගින් පවත්වන කතෝලික ධර්මය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය. | | | |
| 14.5 පැවිදිවරයෙකු/පැවිදිවරියක වීම සඳහා ආගමික අධ්‍යාපන සහ පුහුණු පාඨමාලාව (නොවිෂියේට්) පාඨමාලාව සාර්ථකව හදාරා අවසන් කළ බවට පැවැදි නිකේතනයේ ශ්‍රේෂ්ඨාධිපති/ශ්‍රේෂ්ඨාධිපතිනිය හෝ අදාළ රදගුරුතුමා විසින් නිකුත් කරන ලද සහතිකය. | | | |
| 14.6 ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය මගින් පවත්වනු ලබන ආගමික දැනුම පිළිබඳ ජාතික සහතිකය (ධර්මාචාර්ය) ලබා තිබීම. | | | |
| 14.7 පිළිමතලාව ලංකා දේව ධර්ම ශාස්ත්‍රාලය මගින් පවත්වනු ලබන ධර්මවේදී ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම. | | | |
| 14.8 කතෝලික/ක්‍රිස්තියානි ගුරුවරයෙකු වීමට සුදුසු බවට කතෝලිකයින් සඳහා කතෝලික රදගුරු පදවි සහතිකය/ක්‍රිස්තියානිකයින් සඳහා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ සහතිකය. | | | |
| 14.9 අ. පො. ස. (උසස් පෙළ) ක්‍රිස්තු ධර්මය විෂයය සමත්වීම. | | | |

15.0 ගැසට් නිවේදනයේ 4.8 සහ 4.9 සඳහා හින්දු ධර්මය/ඉස්ලාම් ධර්මය, අයදුම්කරුවන් විසින් පහත කොටස සම්පූර්ණ කළ යුතුයි.

| පාඨමාලාවේ නම | කාලසීමාව | සහතිකය වලංගු දිනය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

16.0 *ගැසට් නිවේදනයේ 4.13 පාඨමාලාව අයදුම්කරන්නන් විසින් පහත කොටස සම්පූර්ණ කළ යුතුයි.*

16.1 ඉල්ලුම් කරන්නේ නිර්මාණකරණය හා තාක්‍ෂණ වේදය/ශිල්ප කලාද යන්න. ..............................

16.2 *ගැසට් නිවේදනයේ 4.13.3 ඡේදයේ තාක්‍ෂණ අධ්‍යයනය පාඨමාලාවට අනුව ඇතුළත් වීමට අපේක්ෂිත අයදුම්කරුවන් රජයේ පිළිගත් ආයතනයකින් ශිල්පීය පාඨමාලාවක් හදාරා නිම කොට තිබේ නම් පහත සඳහන් කොටස සම්පූර්ණ කළ යුතුයි. :-*

| *ශිල්පීය පාඨමාලාවේ නම* | *රජයේ ලියාපදිංචි අංකය හා වලංගු දිනය* | *පවත්වන ලද ආයතනය* | *කාල සීමාව* | *පාඨමාලව සාර්ථක ලෙස නිමකර තිබේ ද?* |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

17.0 *ගැසට් නිවේදනයේ 4.19.1, 4.19.2 ඡේද අනුව බටහිර සංගීතය පාඨමාලාව ඉල්ලුම්කරුවන් සංගීතය පිළිබඳ නිපුනතාවයට අදාළ තොරතුරු ඇතුළත් කළ යුතුය.*

| *වර්ෂය* | *සහතිකය නිකුත් කළ ආයතනය* | *ප්‍රවීණතාව/සමත් පන්තිය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

18.0 අයදුම්කරුගේ ප්‍රකාශය :

(i) මා විසින් ඉදිරිපත් කර ඇත්තේ එක් අයදුම් පත්‍රයක් හා සහතික කළ ඡායා පිටපත් දෙකක් පමණි. එක් ඉල්ලුම් පත්‍රයක් හා එහි ඡායා පිටපත් දෙකකට වඩා ඉදිරිපත් කළ විට මාගේ සියළුම අයදුම් පත්‍ර ප්‍රතික්ෂේප වන බව මම දනිමි.

(ii) මා විසින් අයදුම්පතේ සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. ම විසින් සපයා ඇති තොරතුරු අසත්‍ය හෝ වැරදි බව හෙළි වුවහොත් මා තෝරා ගැනීමට නුසුදුස්සකු වන බවත්, තෝරා ගැනීමෙන් පසුව අසත්‍ය හෝ වැරදි බව හෙළි වුවහොත් මාගේ තෝරා ගැනීම අවලංගු වන බවත් මා දනිමි.

(iii) මා විශ්වවිද්‍යාල ප්‍රවේශයට අයදුම්කර නොමැති බවත්, විශ්වවිද්‍යාලයක/විශ්වවිද්‍යාල විද්‍යායතනයක/වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක ලියාපදිංචි වී නොමැති බවත්/පාඨමාලාවක් හදාරමින් නොසිටින බවත් මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

19. පාසල්/පිරිවෙන් අපේක්ෂකයන් සම්බන්ධයෙන් විදුහල්පතිගේ/පිරිවෙන් අධිපතිගේ ප්‍රකාශය :

මෙම අයදුම්කරු මෙම පාසලේ/පිරිවෙනේ ශිෂ්‍යයෙකු වශයෙන් අ.පො.ස (සා.පෙළ) විභාගයට හා අ.පො.ස (උ.පෙළ) විභාගයට/ප්‍රාචීන ප්‍රාරම්භ විභාගයට පෙනී සිටි බවත්, අයදුම්කරු විසින් ඉහත දක්වා ඇති විස්තර මාගේ දැනුමේ හැටියට නිවැරදි බවත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කර ඇති නිල ප්‍රතිඵල සටහන අනුව ........................ වර්ෂයේ අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී අයදුම්කරු ලබා ගෙන ඇති Z අගය ........................ (අකුරෙන්)........................ බවත් සහතික කරමි.

—————,
විදුහල්පති/පිරිවෙන් අධිපති හිමිගේ
අත්සන හා නිල මුද්‍රාව.

විදුහල්පති/පිරිවෙන් අධිපති හිමිගේ නම :—————.
පාසලේ/පිරිවෙනේ නම හා ලිපිනය :—————.
දිනය :—————.

20. පෞද්ගලික අපේක්ෂකයන් සම්බන්ධයෙන් ප්‍රකාශය :

විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කර ඇති නිල ප්‍රතිඵල සටහන අනුව ...................... වර්ෂයේ අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී මා ලැබූ ඒකාබද්ධ ලකුණු/ Z ලකුණු .................... (අකුරෙන්) ................... බව සහතික කරමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

මා ඉදිරිපිට දී අත්සන් කරන ලදී.

——————,
සාමාදාන විනිශ්චයකාරතැනගේ අත්සන.
නම :
නිල මුද්‍රාව.

දිනය :——————.

09-458

---

## නිවැරදි කිරීම

**ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2007 (2009)**

2009 අගෝස්තු මස 28 වැනි සිකුරාදා දින අංක 1,617 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* I කොටස : (IIඅ) ඡෙදයෙහි විභාග, විභාග ප්‍රතිඵල ආදිය යන කොටස යටතේ ඉහත මාතෘකාවෙන් පළ වූ නිවේදනයේ පිටු අංක 1188හි 7. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් "6. සහකාර අධ්‍යක්ෂ" "7. සහකාර අධ්‍යක්ෂ" ලෙස නිවැරදි විය යුතු අතර එහි "අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්" යටතේ වූ (ඇ) කොටසට පසුව පහත සඳහන් කොටස ඇතුළත් විය යුතුයි.

"8. පර්යේෂණ නිලධාරී

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් කෘෂිකර්මය පිළිබඳ උපාධියක් ලබා තිබීම;

හෝ

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් පහත සඳහන් උපාධියක් ලබා තිබීම.

(i) උද්භිද විද්‍යාව ප්‍රධාන විෂය ලෙසත්, රසායනික විද්‍යාව හෝ සත්ත්ව විද්‍යාව අතිරේක විෂයක් වශයෙන් ලබා තිබීම.

හෝ

(ii) ගණිතය, ප්‍රධාන විෂයය ලෙසත්, උද්භිද හෝ සත්ත්ව විද්‍යාව හෝ රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව අතිරේක විෂයය ලෙසත්, විශේෂ උපාධියක් ලබා තිබීම.

හෝ

(iii) රසායනය විද්‍යාව ප්‍රධාන විෂයය ලෙසත්, උද්භිද විද්‍යාව හෝ සත්ත්ව විද්‍යාව අතිරේක විෂයය ලෙසත්, විශේෂ උපාධියක් ලබා තිබීම.

හෝ

(iv) පිළිගත් විශ්ව විද්‍යාලයකින් කෘෂිකර්මයට අදාළ පශ්චාත් උපාධියක් තිබීම;

හෝ

(v) ගණිතය හා ජීව විද්‍යාව විෂයයන්ගෙන් සමන්විත සාමාන්‍ය උපාධියක් ලබා තිබීම."

තවද,

පිටු අංක 1189හි 8. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් "7. සහකාර වන සංරක්ෂක", "9. සහකාර වන සංරක්ෂක" ලෙස ද නිවැරදි විය යුතු ය.

ඩී. දිසානායක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.

2009 සැප්තැම්බර් මස 02 වැනි දින,
කොළඹ 07,
නිදහස් චතුරශ්‍රය,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

09-669

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.